# ශ්‍රී ලංකා ජනරජයේ
# අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ශ

20................................................ දින අංක .................................................................................. දරණ කොන්ත්‍රාත්තුව
ශ්‍රී ලංකා ජනරජය එක් පක්ෂයකටද කොන්ත්‍රාත්කරු එනම් මින්පසු උරුමක්කාර, පොළුම්කාර අද්මිනිස්ත්‍රාසි බලකාර සහ අවසර ලත් ලැබුම්කාරයින්ද අන්තර්ගත වන සේ මින්පසු "කොන්ත්‍රාත්කරු" යනුවෙන් හඳුන්වනු ලබන
..................................................................................................................................................
පදිංචි .........................................................................................................................................
යන අය අනික් පක්ෂයට ද බැඳී ගිවිසුනා වගන්ති වල නම්.

ශ්‍රී ලංකා ජනරජය ................................................................................................................ යන ස්ථානයේ
..................................................................................................................................................
.................................................................. යථා තත්ත්වයෙන් සහා සම්පූර්ණ කරනු පිණිස කොන්ත්‍රාත්කරු මෙම කොන්ත්‍රාත්තුවකට ඇතුළත්වීමේ අභිලාෂයෙන් සිටී. සැලසුම් ඇති වැඩ විස්තර කොට රේඛා චිත්‍ර, පරිමාණ පත්‍ර පිරිවිතර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළියෙල කරනු ලැබ, එම රේඛා චිත්‍ර, එම පරිමාණ පත්‍ර සහ එම පිරිවිතර සහ මෙවාට දෙපාර්ශ්වය විසින් අත්සන් තබන ලදුව ඇති බැවින්.

දැන් පහත දැක්වෙන පරිදි මෙයින් ගිවිස්නා ලැබේ. එනම් :-

1. මෙහි පහත අවසර දී ඇති පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / පාසල් වැඩ ඉංජිනේරු විසින් නිර්ණය කරනු ලබන අතිරේක වැඩ, අවශ්‍ය වූ වැඩ, වෙනත් කිරීම් යනාදියට යටත් කොට, මෙහි පහත දැක්වෙන මුදලට සරිලන පරිදි මේ සමඟ අමුණනු ලබන කොන්දේසි වලට අනුකූල වන ලෙසද පූර්වෝක්ත චිත්‍ර වල දැක්වෙන ලෙස හෝ පූර්වෝක්ත පරිමාණ පත්‍රවල, පිරිවිතර වල සහ කොන්දේසිවල විස්තර කර හෝ සඳහන් කර ඇති ලෙසද ඉතා හොඳම ද්‍රව්‍ය යොදවා කොන්ත්‍රාත්කරු විසින් නියමිත වැඩය යෝග්‍ය සහ ශක්තිමත් අන්දමින් ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / පාසල් වැඩ ඉංජිනේරු විසින් මැනවින් පිළිගත හැකි අන්දමින්ද ලඳහත්...................................................................... දිනට හෝ ඊට පූර්ව කොට අවසන් කළ යුතුය.
    පූර්වෝක්ත රේඛා චිත්‍ර (එහි සවිස්තර ලැයිස්තුවක් "ඒ" සලකුණින් මීට අමුණා ඇත.) පිරිවිතර (බී සලකුණු) සහ පරිමාණ පත්‍ර ("සී" සලකුණින්) ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ කොන්ත්‍රාත්කරු විසින් තියම අන්දමින් අත්සන් කරන ලදුව. මේ පිළිබඳ සෑම කරුණක්හිදීම මේ ගිවිස්නාවේම අවයව කොටසක් ලෙස සැලකීම හා කියවා තේරුම් ගැනීම කළ යුතුය.

2. මින්පසු අන්දමින් ඇතුළත් කරන " කොන්ත්‍රාත් මුදල් " යනුවෙන් සඳහන් කරනු ලබන රු. ..........................................
......................................./...................................) යන මුදල හෝ කොන්ත්‍රාත්තුව යටතේ එවකට පවත්නා සහ මෙහි පහත වෙනසකනු ලබන උපලේඛන ගාස්තු ප්‍රමාණ වලට අනුකූල වන පරිදි ගෙවිය යුතු වන මුදලක් හෝ එම වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවනු ලැබේ.

3. පූර්වෝක්ත වැඩ ද, මේ ගිවිස්නාවේ කොන්දේසි ප්‍රකාර පනවනු ලබන වෙන යම් එබඳු අතිරේක වැඩද, විධිමත් සහ නියමිත කාලය තුළ කිරීම සඳහා එම වැඩ සපුරාලන අන්දමින් අවසන් කිරීමෙන් මේ ගිවිස්නාව සපුරාලිය හැකි වන ලෙසද වැඩ අවසන් කළ දින පටන් ..........................................................................මසක් ගත වන තෙක් සියලු ම වැඩ සම්පූර්ණ අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වා ගන්නා ලෙසද, මේ ගිවිස්නාවේ කොන්දේසි ප්‍රකාර ශ්‍රී ලංකා ජනරජයට හිමියම් ඇති මුදල් වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු යමක් ඇතොත් ඒ සියළුම මුදල් යථා විධියෙන් ගෙවීමට හැකි වන ලෙසද ......................................................................................................
.........................................................................................................................................නම්
රු.......................................................................(රු......................../..................) වන මුදල ඇපයක් කරන බවට කොන්ත්‍රාත්කරු මෙයින් පිළිගනු ලැබේ. තවද පූර්වෝක්ත මුදල ශ්‍රී ලංකා ජනරජයට කොන්ත්‍රාත්කරු විසින් මෙහිදී උකස් කිරීමෙන්ද යටත් කොට බැඳීමෙන්ද පවරා ඇඳන ලදී.

සංරෝක්ත ගිවිස්නාවේ ප්‍රකාර කොන්ත්‍රාත්තුවේ සියලු වැඩ නිසි පරිදි සම්පූර්ණ කරන තෙක් මේ ගිවිස්නාවේ උද්ගත වන සෑම බැරකමක් ම ගෙවා තමා එයින් නිදහස් වන තෙක් පූර්වෝක්ත මුදල හෝ එයින් යම්කිසි කොටසක් හෝ ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් නොමැත.

කොන්ත්‍රාත්කරු විසින් විශේෂයෙන්ම මෙහි විස්තර කර ඇති පරිදි මේ කොන්ත්‍රාත්තුවට අයත් වැඩ යථා පරිදි අවසන් කරනු ලැබේද ඉනත කියන ලද පරිදි තමාගෙන් අය විය යුතු සියළු මුදල් ගෙවා තමා කෙරේ පැවරී ඇති සියළු වගකීම්, භාර ගැනීම්, කොන්දේසි සහ නියමකර ගැනීම් යථා විධියෙන් සපුරාලනු ලැබේ ද, එවිට පූර්වෝක්ත මුදල වන රුපියල් .................................................................................. (රු......................./............. හෝ එයින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුව ඇති මුදල හෝ මෙහි සඳහන් සවිස්තර කාලාවසානයේදී (මින් පසු කරන නියමයන්ද යටත් කොට) මේ ගිවිස්නාවේ ප්‍රකාර කොන්ත්‍රාත්කරු විසින් තමා සතු සියලු වගකීම් ඉටුකළ බවට සහ පූර්වෝක්ත මුදල වන (රු. ........................................................................(රු......................./............. ක් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුවට ගෙවිය යුතු කිසි මුදලක් නැති බවටද, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පාසල් වැඩ ඉංජිනේරු විසින් නිකුත් කරනු ලබන සහතිකයෙන්ද ඇති කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවනු ලැබේ.

එසේද වුවත් කොන්ත්‍රාත්කරු සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් මෙයින් එළිදරව් ලෙස ම ගිවිසුණ පරිදි, කොන්ත්‍රාත්තුවේ නියමිත වැඩ අවසන් කරන අවස්ථාවේදී කොන්ත්‍රාත්කරු හා ශ්‍රී ලංකා රජය අතරේ කරගත් වෙනයම් කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් යටතේ කොන්ත්‍රාත්කරුගෙන් ශ්‍රී ලංකා රජයට අයවිය යුතු කිසියම් වෙනත් මුදලක් ඇත්නම් මේ කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කරන ලද සහතික ඇප මුදල වන රු. ..........................................................................................................................................................................................
(රු. ........................./.............................) හෝ පූර්වෝක්ත පරිදි මේ යටතේ කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවිය යුතු ඉන් කොටසක් හෝ තමා වෙත රඳවා ගැනීමට සහ කොන්ත්‍රාත්කරුගෙන් ශ්‍රී ලංකා රජයට අයවිය යුතු එබඳු මිලක් මුදලක් හෝ වෙනුවෙන් හිලව්කර ගැනීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු හට හිමිකම් ඇත්තේය.

තවද කොන්ත්‍රාත්කරු හා ශ්‍රී ලංකා රජය අතරේ කරගත් වෙනයම් කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් යටතේ කොන්ත්‍රාත්කරුගෙන් ශ්‍රී ලංකා රජයට අයවිය යුතු කිසියම් මිලක්, මුදලක් වේ නම් පූර්වෝක්ත මුදල වන රුපියල් ..........................................................................(රු. ...................../...................) ඒ සඳහා ඇපයක් වශයෙන් ශ්‍රී ලංකා රජයට එකී කොන්ත්‍රාත්කරු විසින් මෙයින් තව දුරටත් උකස් කිරීමෙන් ද යටත් කොට බැඳීමෙන්ද පවරා දෙනු ලැබේ. තවද සහතික මුදල එයාකාරයෙන් අයකර ගැනීම වශයෙන්, හිලව්කර ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු හට හිමිකම් ඇත්තේය.

4. පූර්වෝක්ත වැඩ, පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා යටතේ කරගෙන යා යුතුයි. වැඩය කරගෙන යා යුතු පිළිවෙළ සම්බන්ධයෙන් හෝ පාවිච්චි කළයුතු ද්‍රව්‍යවල ස්වභාවය හෝ සත්වය සම්බන්ධයෙන් හෝ කළයුතු වැඩ තත්ත්වයන් සම්බන්ධයෙන් හෝ ඔහුගෙන් ලැබෙන සියලු නිර්දේශ සහ විධිවිධාන පහත දැක්වෙන අවස්ථාවන්හි දී තව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුගෙන් ලැබෙන නිර්දේශ ලෙස කොන්ත්‍රාත්කරු විසින් සැලකිය යුතුය.

තවද වැඩ මනා බැලීමටද කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල නොවන යම්කිසි වැඩක් හෝ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට කරුණු හෙළිදරව් කිරීමටද, ඔහුගේ අදහස් පරිදි එසේ අනුකූල නොවන යම්කිසි කොටසක් බිඳ හෙළීමට හෝ වෙනයම් කොටසක් ගැනීමට හෝ කඩා දැමීමට හෝ නුසුදුසු ද්‍රව්‍ය භූමි භාගයෙන් ඉවත් කිරීමට හෝ අනෙකුත් ද්‍රව්‍ය කොතරම් එම ද්‍රව්‍ය වෙන් කොට තැබීමට හෝ තෝරා තැබීමට හෝ එසේම නුසුදුසු යයි සැලකෙන ද්‍රව්‍ය කොතරම් එම ද්‍රව්‍ය සහ වැඩ තෝරා ලකුණු කර තැබීමට හෝ කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට විධාන කිරීමට පරීක්ෂකයාට, මෙහි පහත පවරා දෙනු ලබන පරිදි බලය ඇත්තේය. කොන්ත්‍රාත්කරු කරන ආරම්භක වැඩවලද හරි වැරදි පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා විසින් බැලිය යුතුයි. සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පාසල් වැඩ ඉංජිනේරු වෙත පැවරී ඇති සංවෝක්ත කොන්දේසිවල 10,22,23,31,36,37,38,39,44,48 සහ 55 යන වගන්තිවල නියම සම්බන්ධ කරුණු විට මේ ගිවිසුම යටතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පාසල් වැඩ ඉංජිනේරු හට ඇති බලතල යටතේ කවර නියමයක් හෝ ක්‍රියාත්මක කිරීමට පාඨශාලා වැඩභාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා හට බලය ඇත්තේය.

එසේද වුවත් මේ ගිවිසුමට අයත් කවර කරුණක් හෝ සම්බන්ධයෙන් අවසාන තීරණය දීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුව ඇත්තේය.

අතිරේක වැඩ ගැන ගිවිසුමේ යම්කිසි වෙනස්කම් කිරීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පාසල් වැඩ ඉංජිනේරු හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ක්‍රියා කිරීමට පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාට බලයක් නැත.

5. මේ ගිවිසුමේ සහ/හෝ වෙනසුම් වල වචන වෙනුවෙන් ආරෝපනය කර ඇති තේරුම් පහත සඳහන් පරිදි දත යුතුයි. එනම් :-

(ඒ). "අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්" යන්නෙන් එවකට ශ්‍රී ලංකා රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ධූරය දරණ නිලධාරියා හැඟවෙයි.

(බී). "කොන්ත්‍රාත්කරු" යන්නෙන් මෙහි වෙනසුම ලබන වැඩ කිරීමට, අවසන් කිරීමට සත් වූ පරිදි නඩත්තු කිරීමට පවරාගත් පුද්ගලයා හෝ පුද්ගලයන් ව්‍යාපාර ආයතනය හෝ ව්‍යාපාර ආයතන, සමාගම් හෝ සමාගම් හැඟවෙයි. එමෙන්ම ඔහුගේ/ ඔවුන්ගේ උරුමක්කාර, පොලුම්-සාර, අද්මිනිස්ත්‍රාසි බලකාර සහ අවසර ලත් ලේඛිම්කරුවෝ ද එයට ඇතුළත් වෙති.

(සී). "පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ"/"නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ"/ "පාසල් වැඩ ඉංජිනේරු" යන්නෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ.......................................................................................................ප්‍රාදේශයේ/ දිස්ත්‍රික්කයේ එවකට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු ධූරය දරණ නිලධාරියා හැඟවෙයි.

(ඩී). "පාඨශාලා වැඩ භාර උප පරීක්ෂකවරයා" යන්නෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ එවකට පාඨශාලා වැඩ භාර උප පරීක්ෂකවරයා හෝ/සහ කොන්ත්‍රාත්කරු විසින් කරනු ලබන වැඩ සත්‍ය පරිදි පරිපාලනය කිරීමට එවකට සත් භූමි භාගයේ වැඩභාරව සිටින සහ ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියා හැඟවෙයි.

(ඊ). "පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා" යන්නෙන්..........................................................................පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එවකට පාඨශාලා වැඩ භාර පරීක්ෂක ධූරය/ දරණ නිලධාරියා හැඟවෙයි.

(එෆ්). "පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ" යන්නෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ එවකට පාසල් ගොඩනැගිලි භාර පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ ධූරය දරණ නිලධාරියා හැඟවෙයි.

(ජී). "ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ එවකට අධ්‍යක්ෂ ධූරය දරණ නිලධාරියා හැඟවෙයි.



CamScanner

(එච්). "වැඩ" යනුවෙන් මේ ගිවිසුමට යටත්ව කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු හෝ කළ යුතු සියලුම වැඩ හැඟවෙයි.
(අයි). "මාසය" යනුවෙන් ලිත් මාසය හැඟවෙයි.
(ජේ). "කොන්ත්‍රාත් ලියකියවිලි" යන්නෙන් මෙහි සඳහන් ගිවිසුම, රේඛා චිත්‍ර, වෙසෙසුම් සහ පරිමාණ පත්‍රය හැඟවෙයි.
(කේ). "පරිමාණ පත්‍රය" යන්නෙන් මේ සමග අමුණා ඇති පරිමාණ පත්‍රය හැඟවෙයි.
(එල්). "උපලේඛිත ගාස්තු ප්‍රමාණ" යන්නෙන් පරිමාණ පත්‍රයෙහි සඳහන් ගාස්තු ප්‍රමාණ හැඟවෙයි.
(එම්). "රේඛා චිත්‍ර" යන්නෙන් මේ ගිවිසුමේ විධිවිධාන අනුව අධ්‍යාපන නිලධාරියා විසින් (එසේ නිකුත් කර ඇත්නම්) නිකුත් කළා වූද නිකුත් කිරීමට ඇත්තාවූද සියලුම රේඛා චිත්‍ර හැඟවෙයි.
(එන්). "කොන්ත්‍රාත් මුදල" යන්නෙන් කොන්ත්‍රාත් කරුට ගෙවීමට ඇති මුදල හැඟවෙයි.
(ඕ). "භූමිභාගය" යන්නෙන් සවර අනුරයින් හෝ නියමිත වැඩයට පාවිච්චි කරන ප්‍රදේශය හැඟවෙයි.
(පී). "කොන්ත්‍රාත්තු වටිනාකම" යන්නෙන් පරිමාණ පත්‍රයේ දක්වා ඇති වටිනාකම හැඟවෙයි.

මෙයට සාක්ෂි වශයෙන් පූර්වෝක්ත උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.................................................. ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් ද පූර්වෝක්ත.................................................. කොන්ත්‍රාත්කරු ද මෙම ගිවිසුමට මෙහි පහත දැක්වෙන ස්ථාන සහ දිනවල දී තම අත්සන තැබූහ.

කියන ලද කොන්දේසි කවරේ ද යත් :-

1. මේ ගිවිසුමේ විස්තර කර ඇති වැඩය/ වැඩ සහ අත්සන් තැබූ රේඛා චිත්‍ර, පරිමාණ පත්‍රය සහ වෙසෙසුම් එකට ගත් කල ඒවායේ සඳහන් සියලුම ආදායම් වැඩ වෙනුවෙන් ද අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සැපයීමද එහි දැක්වෙන වැඩය/ වැඩ සහා අවසන් කිරීමද මේ කොන්ත්‍රාත්තුවට අයත් කරුණු වන්නේය. එමෙන්ම එකී වැඩය/ වැඩ විධිමූ පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නාවූ සියලුම ද්‍රව්‍ය, යන්ත්‍රාගාර උපකරණ, මෙවලම් සහ කම්කරු පිරිස සැපයීම ද පළාත් අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් වරින්වර නියම කරනු වෙනස් කිරීම සහ අතිරේක වැඩ කිරීම ද එයට ඇතුළත් වන්නේය. — *කොන්ත්‍රාත්තු විෂය ප්‍රමාණය*

වැඩය කිරීන් පරිදි සහ සත් වූ පරිදි කිරීමට ප්‍රමාණවත් ලෙස අවශ්‍ය වන්නාවූ හෝ පසුව අවශ්‍ය වේ යයි හැඟී යන්නා වූ හෝ ද්‍රව්‍ය සහ කම්කරු පිරිස පිළිබඳ සියලු විස්තර, රේඛා චිත්‍රවල සහ වෙසෙසුම් වල සම්පූර්ණ වශයෙන් වෙනසා හැනත්, පූර්වෝක්ත කොන්ත්‍රාත් මුදලට එය අඩංගු වූ ලෙස සලකනු ලැබේ.

2. කොන්ත්‍රාත් මුදලට ඇතුළත් කර ඇති වැඩවල ප්‍රමාණය සහ තත්ත්වය රේඛා චිත්‍රවල සහ/ හෝ පත්‍රයේ සහ/ හෝ මේ ගිවිසුමේ සඳහන් වෙසෙසු මෙහි හෝ දක්වා ඇති ප්‍රමාණය සහ තත්ත්වය ලෙස සලකනු ලැබේ. — *පරිමාණ පත්‍ර*

3. මෙහි සඳහන් ගිවිසුම, රේඛා චිත්‍ර, පරිමාණ පත්‍රය සහ වෙසෙසුම් කොන්ත්‍රාත්කරු විසින් මැනවින් පරීක්ෂා කළ ලෙස සලකනු ලැබේ. මේ ගිවිසුමේ හෝ පරිමාණ පත්‍රයේ හෝ වෙසෙසුම්වල කිසියම් කොටසක් සම්බන්ධයෙන් ඔහුට විමසීමක් වේ නම් එම විමසිය පහසර ගනු සඳහා කොන්ත්‍රාත්තුවකට අත්සන් කිරීමට පූර්ව ඒ සම්බන්ධ විස්තරයක් ලියවිල්ලකින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුය. — *කොන්ත්‍රාත්කරු සියලු විස්තර දැනගත යුතු බව.*

4 (ඒ). (සැලසුම්වල සහ එහි අංගවල ලකුණු කර ඇත්තේ වැඩ පිළිබඳ කොටස් පමණක් වුවත් සියලුම වැඩ කොන්ත්‍රාත්තුවට අයත් වූත් එහි ඇතුළත් කර ඇත්තා වූත් වැඩ වශයෙන් සැලකිය යුතුවා පමණක් නොව රේඛා චිත්‍ර, පරිමාණ පත්‍ර වෙසෙසුම් යන එකත් පරිමාණ පත්‍රයේ සහ වෙසෙසුම් වල පමණක් සඳහන් කරනු ලැබූ එවද වැඩද එකී සැලසුම්වල සහ අංගවල විශේෂයෙන් අදිනු ලැබූ විස්තර ලෙස සලකා කොන්ත්‍රාත්තුවකට ඇතුළත් කරනු ලැබේ. පරිමාණ පත්‍රයේ සහ වෙසෙසුම්වල වෙසෙසනු නොලැබූ කරුණු තිබිය හැකි බැවින්ද සැලසුම්වල සහ එම අංගවල අදිනු නොලැබූ කරුණු තිබිය හැකි බැවින්ද සැලසුම්වල සහ එම අංගවල අදිනු නොලැබූ කොටස් තිබිය හැකි බැවින්ද එසේ අන්තැරුණු සියලු විස්තර කොන්ත්‍රාත්තුවට ඇතුළත් ලෙස සැලකිය යුතුය. මේ කොන්දේසි, රේඛා චිත්‍ර, පරිමාණ පත්‍රය සහ වෙසෙසුම් එක්කොට ගත් කල හාත්පසින් ම එයට අනුකූල වන පරිදි සියලුම වැඩ යථා විධින් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළයුතු යයි මෙයින් පැහැදිලි ලෙසම අදහස් කරනු ලැබේ. — *වෙසෙසුම් වල හෝ සැලසුම්වල සඳහන් කිරීමට බැරි වූ කරුණු*

(බී). මේ ගිවිසුමට අත්සන් කර සති දෙකක් ඇතුළත් වැඩ ආරම්භ කළ යුතු අතර මසක් ඇතුළත සැලකිය යුතු ප්‍රමාණයක වැඩ කර තිබිය යුතුය.

5. රේඛා චිත්‍රවල සහ/ හෝ පරිමාණ පත්‍රයේ සහ/ හෝ වෙසෙසුම්වල සහ/හෝ වරින්වර ඔහුට නිකුත් කරනු ලබන නිවේදනවල හෝ යම්කිසි විෂමතාවයක් ඇතිවූවහොත් හෝ. ඒ කියන ලද කිසිවක යම්කිසි අනුමිතතාවක්, වැරදීමක් හෝ සඳහන් කිරීමට බැරිවීමක් හෝ ඇති වුවොත් ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරවා ගැනීම පිණිස ලියවිල්ලකින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ අවධානය යොමු කළ යුතුය. — *විෂමතා*

මේ ආරක්ෂණ විධානය නොසලකා සැරසෙමින් නියමිත වැඩවල දෝෂයන් ඇති වුවහොත් ඒ පිළිබඳව කොන්ත්‍රාත්කරු වගකිව යුතු වන්නේය. එසේවුවද වුවත්, ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි ද ඇඳීම් විස්තර සහ/ හෝ වෙනස්කම් සහ/ හෝ පරිමාණ පත්‍ර ගිවිසුමෙන් අවලංගු වන බැව් දත යුතුය. එසේම යම්කිසි විෂයක් පිළිබඳ විස්තරයක් සම්බන්ධයෙන් වෙනස්කම්, පරිමාණ පත්‍රයෙන් අවලංගු වන අතර පරිමාණ පත්‍රය, ඇඳීම් විස්තර මඟින් අවලංගු වෙයි. එසේම කුඩා පරිමාණ සැලසුම් අතර විෂමතාවයක් වේ නම් පසුව ඇති සැලසුම් අතර විෂමතාවයක් වේ නම් පසුව ඇති සැලසුම් පත්‍ර ඇති සැලසුම් මඟින් අවලංගු වෙයි.

**වැරදි මඟින් සිදුවිය හැකි හානි කොන්ත්‍රාත්කරු විඳගත යුතු බව**

6. ඇඳීම් විස්තරවල සහ/ හෝ පරිමාණ පත්‍රයේ සහ/ හෝ වෙනස්කම්හි ඇති විය හැකි වැරදි හෝ අත්හැරීම් නිසා සිදුවිය හැකි පාඩුවක්, හානියක් වේනම් ඒවා කොන්ත්‍රාත්කරු විසින් විඳගත යුතුය. කොන්ත්‍රාත්කරුගේ ටෙන්ඩරයේ ගණන් බැලීම හෝ අන් කරුණු පිළිබඳව නිරවද්‍යතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජය හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු වගකීමට බැඳී නැත.

**කොන්ත්‍රාත්කරුට කරනු ලබන නියෝග**

7. (ඒ). මෙහි හෝ වෙනස්කම්වල එසේ නියම කර තිබෙන්නේ නැතිව කොන්ත්‍රාත්කරුට දෙනු ලබන සියලු නියෝග සහ නිර්දේශ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් ලියවිල්ලකින් දියයුතුය.

(බී). පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු වෙත යම් නියෝජිතයෙකු හෝ වැඩවල තත්ත්වය හෝ සම්බන්ධ යම්කිසි දෝෂයක් හෝ අත්හැර දැමීම සහ වෙනත් කිරීම් යනාදියක් වූ විගසම එය සටහන් කර තැබීමට කොන්ත්‍රාත්කරු විසින් වැඩපොළේ රෙජිස්ටරයක් තබා තිබිය යුතුය.

**සියලු වැඩ වැඩපොළේදීම කළයුතු බව**

8. සියලු ම වැඩ භූමිභාගයේදීම කළයුතු අතර යම්කිසි වැඩක් බැහැරදී කළයුතු නම් ඒ සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ අවසර ලියවිල්ලකින් ලබා ගත යුතුය.

සිමෙන්ති වැඩ සහ ගෙඩිම් වැඩ පාඨශාලා වැඩ පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාගේ හෝ ඔහුගේ නියෝජිතයාගේ ඉදිරිපිටදීම කළ යුතුය.

**රාත්‍රී සහ සති අන්තයේදී කරන වැඩ**

9. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ අනුමැතිය නොමැතිව රාත්‍රී හෝ සති අන්තයේ හෝ ශ්‍රී ලංකා ජනරජයේ නිවාඩු දින වලදී මේ කොන්ත්‍රාත්තුවට අයත් කිසිදු වැඩක් නොකළ යුතුය. එසේත් එසී දිනවල වැඩ කිරීමට බලාපොරොත්තු වන්නේ නම් අවසර ලබා ගැනීම සඳහාද සුදුසු පරිදි පරිපාලනය විධිවිධාන යෙදීම සඳහාද යථා කාලයේදී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු හට දැනුම් දිය යුතුය.

**භූමිභාග ලබා ගැනීම සහ එහි ප්‍රවේශය**

10. ස්ථිර ගොඩනැගිලි ඉදිර කිරීම සඳහා අවශ්‍ය භූමිභාග ද එහි ප්‍රවේශ වීමට අයිතිය ද ශ්‍රී ලංකා ජනරජය මඟින් සලසනු ලැබේ. ගිවිසුමට වලංගු කළ විගස ශ්‍රී ලංකා ජනරජය මඟින් වැඩය ආරම්භ කිරීමට සෑහෙන තරම් භූමිභාග කොන්ත්‍රාත්කරුට දෙනු ලැබේ. ඊට අනතුරුව වැඩ කරගෙන යන විට භූමි භාග පිළිබඳ උවමනාවල් පැන නගින හැටියට භූමි භාගයේ ඉතිරි කොටසින් ප්‍රමාණවත් කොටසක් කොන්ත්‍රාත්කරුට දෙනු ලැබේ. එසේත් යථා කාලයේදී භූමිභාග සපයාදීම කළ නොහැකි නොවුවහොත් එසේ නොහැකි වීමෙන් තමාට අලාභයක් හෝ පාඩු සිදුවී යයි ශ්‍රී ලංකා ජනරජයෙන් වන්දි ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් නැත්තේය. එහෙත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ නිගමනය හා තීරණය පරිදි වැඩය අවසන් කිරීම පිළිබඳ කාලය දීර්ඝ කරවාගත හැක . ඔහුගේ තීරණයට කොන්ත්‍රාත්කරු යටත් වන්නේය.

තාවකාලික වැඩ හෝ එබඳු වෙනත් කිසියම් සඳහා අවශ්‍ය වන භූමි ඉඩකඩ කොන්ත්‍රාත්කරු විසින් තමන්ගේ වියදමින් ලබාගත යුතුය.

තමා විසින් තාවකාලික වශයෙන් වැඩට යොදා ගත් ඉඩම්වලට ප්‍රවේශවීමේ හිමිකම් සඳහා ඒවායේ අයිතිකරුවන්ට කුලී ගෙවීමට කොන්ත්‍රාත්කරු සියලු කටයුතු සැලැස්විය යුතුය. තවද තාවකාලික වශයෙන් තමා යොදා ගත් භූමි භාගයේ හෝ වෙනයම් පැනනැගිය හැකි පුද්ගලික පාරවල් පටු පාරවල්, අඩි පාරවල්, කිහිරවල්, කරත්ත පාරවල්, කුඹුරු, වගාකළ බිම, වැටවල් ඇලවල් යනාදිය ද හෝ එහි ඉඩමට හෝ වෙනයම් දෙයකට හෝ යම්කිසි අලාභයක් හෝ හානියක් සිදුවුයේ නම් කොන්ත්‍රාත්කරු විසින් අප්‍රමාදව ඒවා අලුත්වැඩියා කිරීම හෝ ඒ වෙනුවෙන් වන්දි ගෙවීම හෝ කළ යුතුය. මහපාරවල්, අඩි පාරවල් , ඇළ හා කාණු, ද්‍රව්‍යයන්ගෙන් තොරව පිරිසිදුව තැබිය යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් නිර්දේශ කර ඇති පරිදි භූමි භාගයට ගමනාගමන ප්‍රවේශ මාර්ග තනා ගත යුතුය. කාණු හරහා සුදුසු ලෙස තාවකාලික බෝක්කු තනාගත යුතුය. බැඳ තිබෙන කාණ්ඩවල සහ තාවකාලික හේට්ටු දමා වැඩය අවසන් වූ පසු එය ඉවත් කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් පිළිගන්නා පරිදි එම ස්ථාන හෙමිඳුල් හෝ අයිතිකරුවන් දේ වලට සිදුවූ අලාභයන් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කළ යුතුය.

**අයුතු ලෙස ඇතුළුවීම**

11. කොන්ත්‍රාත්කරු විසින් වැඩට යොද ගත යුතු ප්‍රදේශය වරින්වර පැහැදිලි ලෙස විස්තර කරනු ලැබේ. එම ප්‍රදේශය තුළ පමණක් සිය කටයුතු කරගෙන යා යුතු අතර, සිය සේවකයන් එයින් පිටතට නොයායුතු ලෙසද කොන්ත්‍රාත්කරු විසින් වග බලා ගත යුතුය. අන්සතු භූමිවලට අයුතු ලෙස ඇතුළුවීම



CamScanner

සම්බන්ධයෙන්ද මේ කොන්ත්‍රාත්තුව යටතේ උද්ගත වන අලාභ හානි සම්බන්ධයෙන්ද කොන්ත්‍රාත්කරු විසින් වගකිව යුතුය. යම් කිසිවෙකු හදිසි අනතුරකට භාජන වුවහොත් හෝ දේපල හා තරක් ආදියට හෝ සතෙකුට හෝ කෙනෙකුට හෝ දෙයකට අලාභයක්, තුවාලයක්, හානියක් සිදුවුවහොත් හෝ එයින් උද්ගතවන අලාභ ඉල්ලීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු ශ්‍රී ලංකා ජනරජයට වන්දි ගෙවිය යුතුය. එසේ ඇතිවන අලාභයක්, හානියක් සම්බන්ධයෙන් යම් කිසිවෙකු ශ්‍රී ලංකා ජනරජයෙන් වන්දි ඉල්ලුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එසේ ගෙවනු ලබන මුදල කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලෙන් කපා ගනු ලැබේ. කොන්ත්‍රාත්කරුගේ අනුමැතිය හෝ අනුමැතිය හෝ අනුදැනීම නැතිව ද යම්කිසි මුදලක් එසේ ගෙවනු ලැබුවහොත් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයට විරුද්ධව සිය විරෝධය පළ කිරීමට හෝ ප්‍රශ්න කිරීමට කොන්ත්‍රාත්කරුට බලයක් නොමැත.

12. මේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කරනු ලබන සියලුම වැඩවලට අදාළ වන්නාවූ ආඥා පනතක විධිවිධාන, තම වියදමින් ම කොන්ත්‍රාත්කරු විසින් පිළිපැදිය යුතුය. එසේම යම්කිසි නගර සභාවක් මගින් හෝ ප්‍රාදේශීය හෝ මහා මාර්ගික බල මණ්ඩලයක් මගින් හෝ නීත්‍යානුකූලව පනවනු ලබන සියලුම කොන්දේසි වලට අනුකූලවිය යුතුය. ගෙවිය යුතු සියලු ගාස්තු ආදිය එම මණ්ඩල වලට ගෙවිය යුතුය. — *ව්‍යවස්ථාපිත අණපනත් සහ ප්‍රාදේශීය රෙගුලාසි*

13. වැඩ කෙරෙන හෝ කරගෙන යන මුළු කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින් වැට සවිකොට බැඳීමෙන් ද ආලෝක හා මුරකරුවන් සැපයීමෙන් සහ අනෙකුත් අවශ්‍ය විධි විධාන යෙදවීමෙන් ද ජීවිත හා දේපල ආරක්ෂා කිරීමට සියලු කටයුතු සැලසිය යුතුය. එබඳු ආරක්ෂා විධිවිධාන සැපයීම අතපසු කිරීමෙන් උද්ගතවන සියලු අනතුරු සහ අලාභ හානි සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිව යුතුය. — *වැටවල් බැඳීම ආලෝක කිරීම සහ රැකවල් ගැනීම*

14. උල්පත්, ඇළදොළ සහ දිය පාරවල් වල ජලය අපිරිසිදු වීමෙන් මිනිසුන්ට පශුන්ට, මත්ස්‍යයන්ට හා වෘක්ෂලතාදීන්ට හානි සිදු විය හැකි බැවින් එම ජලය අපිරිසිදු නොකිරීමට වගබලා ගත යුතුය. කොන්ත්‍රාත්තුව පවත්නා කාලය තුළ එසේ ජලය අපිරිසිදු වීමෙන් පසුව හැකිවන අලාභහානි සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු ශ්‍රී ලංකා ජනරජයට වන්දි ගෙවිය යුතුය. — *ඇළදොළ හා දිය පාරවල් අපිරිසිදු කිරීම.*

15. (ඒ). ද්‍රව්‍ය ආරක්ෂාව සහ ගබඩා කිරීම සඳහා අවශ්‍ය හා නිර්දේශ කරන ලද පරිදි පිළියකට, පොල් අතු හෝ වෙනයම් අනුමත වර්ගයක ද්‍රව්‍ය යොදවා කොන්ත්‍රාත්කරු විසින් මඩු සාදා කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් වූ විගස ඒවා ඉවත් කළ යුතුය. — *ද්‍රව්‍ය හා වැඩ ආරක්ෂා කිරීම*

(බී). අව්වෙන් සහ වැස්සෙන් ද්‍රව්‍ය කිසි පරිදි ආරක්ෂා කිරීම සඳහා යෝග්‍යතාවයක් ආවරණ සැපයිය යුතුය.

(සී). වැඩ කරගෙන යන විට අවසන් කරන ලද වැඩවලට හානි සිදු නොවන ලෙස වග බලාගත යුතුය.

16. (ඒ). කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් නියෝගයක් කළ විට කොන්ත්‍රාත්කරු තමා විසින් සාදන ලද සියලුම තාවකාලික ගොඩනැගිලි සහ/ හෝ තාවකාලික වැඩ කටයුතු ආදිය ඉවත් කළ යුතුය. තාවකාලික මාර්ග සහ පාරවල් වසා දැමිය යුතුය. ඔහු විසින් පාවිච්චි කරනු ලැබුවාවූද, පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබුවාවූද සියලුම යන්ත්‍රාගාර සහ අතිරික්ත ද්‍රව්‍ය ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනයම් අය හෝ සතු ඉඩම්වලින් බැහැර කළ යුතුය. එසේම අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මනාසේ පිළි ගන්නා පරිදි ඔහු විසින් සෑම තාවකාලික ගොඩනැගිල්ලක හෝ මාර්ගයක බිම/බිම් මුලින් තිබුණු ලෙසට සමතලා කළ යුතුය. — *තාවකාලික ගොඩනැගිලි සහ තාවකාලික වැඩ ආදිය ඉවත් කිරීම*

(බී). කොන්ත්‍රාත්කරු විසින් තමාගේම වියදමින් සියලු අතිරික්ත ද්‍රව්‍ය සහ රොඩු සියල්ලම කල්තියා ඉවත් කළ යුතු අතර, පාඨශාලා වැඩ භාර උප - පරීක්ෂකවරයා විසින් නිර්දේශ කරනු ලබන පරිදි සියලු වැඩ සහ පරිසරය පිරිසිදු ප්‍රසන්න තත්ත්වයකින් පවතින සේ කොට වැඩ අවසානයේදී එලෙසම තබා යා යුතුය.

එය එසේ කරන තෙක් "අවසන් සහතිකය" නිකුත් කරනු නොලැබේ.

17. කොන්ත්‍රාත්කරු විසින් පාඨශාලා වැඩ භාර උප-පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහාද උපකරණ සිතියම් සහ ලියකියවිලි සුරැකිව තබා ගැනීම පිණිස ද නිර්දේශ කරනු ලබන ස්ථානයේදී (අඩු වශයෙන් දිග පළල 12'x10'ක් සහ උසින් බිම සිට යටලීය දක්වා 7' 6' ක් වූ) මැනවින් එළිය වැටෙන නොතෙමෙන සුළු කාර්යාලයක් තමාගේ වියදමින් සෑදිය යුතුය. කුටියේ බිම ලෑලි අතුරා යතුරු දමන ලාච්චු සහිත මේස්තුවක්, කාර්යාල හා පුටුවක් ද සහ පුටුවක් සපයා තැබිය යුතුය. — *පාඨශාලා වැඩ භාර උප පරීක්ෂකවරයා සඳහා වූ කාර්යාලය*

18. (ඒ). පාඨශාලා වැඩභාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා හට ම වෙන්වූ වැසිකිළියක් කොන්ත්‍රාත්කරු විසින් තමාගේ වියදමින් නිර්දිෂ්ට ස්ථානයක සෑදිය යුතුය. වැසිකිළිය වැඩ ආරම්භ කළ විගසම සෑදිය යුතු අතර වැසිකිළි බිම අනුමත වර්ගයක වියළි පසින් පිරවිය යුතුය. කොන්ත්‍රාත්කරු විසින් තමාගේ වියදමින් එය පවත්වාගත යුතු අතර, නොකඩවා විෂබීජ නාශක ද්‍රව්‍ය වර්ග ඉස්සවිය යුතුය. — *පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා සඳහා වූ වැසිකිළිය*



CamScanner

කම්කරු ප්‍රයෝජනය සඳහා තාවකාලික ලයිම්

(ඕ). කම්කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සාදනු ලබන තාවකාලික ලයිම් නිවාස රෙගුලාසි වලට අනුකූල විය යුතුවාක් මෙන්ම කොන්ත්‍රාත්තුව පවත්නා කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින් එම ලැයිම් සෞඛ්‍යාරක්ෂක තත්වයකින් පවත්වා ගත යුතුය. කොන්ත්‍රාත්කරුගේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා සාදනු ලබන තවර හෝ ගොඩනැගිල්ලක අලුත් වැඩියාව, නඩත්තුව ආදිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නියුත් කරනු ලබන සියලුම උපදෙස් ඔහු විසින් පිළිපැදිය යුතුය.

කම්කරු ප්‍රයෝජන සඳහා වැසිකිළි

19. කොන්ත්‍රාත්කරුගේ කම්කරුවන්ට කර්මාන්ත භූමිය අපිරිසිදු නොකරන ලෙස තහනම් කළ යුතුය. එසේ හෙයින් කොන්ත්‍රාත්කරු විසින් තමන්ගේ වියදමින් නිර්දිෂ්ට ප්‍රමාණයට කම්කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස අවශ්‍ය වැසිකිළි සහ මඩු සාදා පිරිසිදු සෞඛ්‍යාරක්ෂක තත්වයකින් ඒවා නඩත්තු කොට වැඩ අවසානයේදී ඒ සියල්ල ඉවත් කොට භූමිභාගය පිරිසිදු තත්වයකින් තැබිය යුතුය. වැසිකිළි පතිට්ටු වර්ගයේ ඒවා විය යුතුවාක් මෙන්ම එම පතිට්ටු නොකඩවා ශුද්ධ කළ යුතුය. සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රාදේශීය බල මණ්ඩලවල සියලු අතුරු ව්‍යවස්ථා සහ නීතිරීති කොන්ත්‍රාත්කරු විසින් සැම විටම පිළිපැදිය යුතුය.

වැඩ ඇරඹීම කම්කරුවන් සහ උපකරණ සැපයීම

20. කොන්ත්‍රාත්කරු තම වියදමින් ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් සපයනු ලබන රේඛා වලට අනුව වැඩ ඇරඹීම කළ යුතුය. සිදුවිය හැකි වැරදි සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිව යුතු අතර වැරදි ලෙස වැඩ ඇරඹීමෙන් සිදුවන දෝෂ ඔහු විසින් තමන්ගේම වියදමින් නිවැරදි කර ගත යුතුය. අරඹන ලද සියලු වැඩ පරීක්ෂා කර බැලීමට පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා / උප පරීක්ෂකවරයාට බලය තිබේ. එසේත් ලයිම් සහ මට්ටම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. අරඹනු ලබන වැඩ පරීක්ෂා කිරීමට ද කරනු ලබන වැඩ වරින්වර මැන බැලීමට සහ සපයන ලද ද්‍රව්‍ය සෝදිසි කර බැලීමට පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිස අවශ්‍යවන කම්කරුවන් ආදේශ හා උපකරණ සැපයීමට සහ භූමිභාග එළිකර තැබීමට පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා විසින් නියෝග කරනු ලැබුවොත් කොන්ත්‍රාත්කරු විසින් එසේ කළ යුතුය. කොන්ත්‍රාත්තුව පවත්නා කාලය තුළ එහි තිබෙන සියලුම සැලසුම්, ලියකියවිලි පොත්පත් සහ උපකරණ සොරුන්ගෙන් සහ ගින්නෙන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිව යුතුය. එමෙන්ම පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාගේ කාර්යාලයේ එකී කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් තිබෙන සියලු ම එබඳු දේවල් කොන්ත්‍රාත්කරුගේ ආරක්ෂණ පොතියකට ඇතුළත් විය යුතුය. ශ්‍රී ලංකා ජනරජය සතු හෝ ශ්‍රී ලංකා ජනරජයට අයිතිවාසිකම් ඇත්විය හැකි හෝ ඔවුවලට සොර සතුරන්ගෙන් හෝ ගින්නෙන් හෝ වෙනයම් උපද්‍රවයකින් හෝ අලාභයක් හෝ හානියක් සිදුවුවහොත් කොන්ත්‍රාත්කරු විසින් එම අලාභය ශ්‍රී ලංකා ජනරජයට ගෙවිය යුතුය. එමෙන්ම එසේ හානි වූ විනාශ වූ ඔවු කොන්ත්‍රාත්කරු සතු දේපල නම් ඔහු විසින් එම දේවල් නැවත සැපයිය යුතුය.

වැඩ පිළිවෙළ නියම කිරීමට පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාට ඇති බලය

21. පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා විසින් ලියවිල්ලකින් නිර්දේශ කරනු ලබන පරිදි කොන්ත්‍රාත්කරු විසින් භූමිභාගයේ ඒ ඒ තැන්වල සහ ඒ ඒ පිළිවෙළට වැඩ ඇරඹිය යුතුය. පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා විසින්, ගිවිසුමේ කොන්දේසි වලට කිසි අයුරකින් පටහැනි නොවන පරිදි යම්කිසි වැඩක හෝ ඉන් කොටසක අනු පිළිවෙළ වෙනස් කළ යුතු යයි තමාට හැඟී ගියහොත් එසේ කිරීමට කොන්ත්‍රාත්කරුට වරින්වර නිර්දේශ කරනු ලැබේ. එවැනි උපදෙස් ලැබුණු විට කොන්ත්‍රාත්කරු විසින් එම නිර්දේශ අනුගමනය කළ යුතුය. වැඩ පිළිවෙළ වෙනස් කිරීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් නැත්තේය.

වැඩ තාවකාලික වශයෙන් නැවැත්වීම

22. මේ ගිවිසුමේ කොන්දේසි වලට කිසිදු ප්‍රකාරයකින් පටහැනි නොවන පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් තමාට අවශ්‍ය යයි හඟගත කාල පරිච්ඡේදයක් තුළ එම වැඩ හෝ ඉන් යම්කිසි කොටසක වැඩ හෝ තාවකාලික නතර කිරීමට ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරුට දැනුම් දෙනු ඇත. එබඳු දැනුම්දීමක් තමාට ලැබුණු විට තාවකාලිකව නතර කිරීමට නියෝග කරන ලද වැඩ කොන්ත්‍රාත්කරු විසින් නොකළ යුතු අතර අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු ලියවිල්ලකින් නැවත නියෝගයක් හෝ බලයක් ලබන තෙක් එම වැඩ නැවත පටන් නොගත යුතුය. එබඳු තාවකාලික වැඩ අත්හිටුවාලීමක් සම්බන්ධයෙන් වන්දි ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් නැත්තේය.

නොවැළැක්විය හැකි හේතු නිසා වැඩ පමා වීම

23. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ මතයේ හැටියට කිසියම් නොවැළැක්විය හැකි හේතු නිසා හෝ අහිතකර විෂම කාලගුණ තත්ත්වය නිසා හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු හට පෙන්නුම්කර ඇති පරිදි හෝ පෙනී යන පරිදි වෙනයම් නොවැළැක්විය හැකි බාධකයක් නිසා හෝ වැඩ නැවැත්වීමට සිදුවුවහොත් වැඩ සම්පූර්ණ කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් යුක්ති සහගත ලෙස ප්‍රමාණවත් කාලයක් වැඩිපුර දෙනු ලැබේ. එසෙයුදු වුවද පමා වීම වැළැක්වීමට කොන්ත්‍රාත්කරු විසින් නිරතුරු උත්සාහ දැරිය යුතුවාක් මෙන්ම වැඩ කරගෙන යාම සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් මැනවයි ඒත්තු ගන්නා යුක්ති සහගත ලෙස අවශ්‍ය වන සැම දෙයක්ම ඔහු කළ යුතුය.



CS CamScanner

24. ගිවිසුමෙහි ඒ ඒ ඛණ්ඩ විශේෂයෙන් සඳහන් කර ඇත්නම් හැර, තමා විසින් කළ යුතු ඒ ඒ තාවකාලික හා ස්ථිර වැඩ කරා පරිදි ඉටු කිරීමට අවශ්‍ය වන සෑම වර්ගයකම කම්කරුවන් ද කර්මාන්ත මගින් ගෙන යාම හා සුළු වෙනත් ද්‍රව්‍යාණ ආයුධ, මෙවලම් යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ අනිකුත් ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් තමාගේම වියදමින් සපයා ගත යුතුය. එමෙන්ම යම්කිසි නොවැලැක්විය හැකි කර්මාන්තයක් කරගෙන යන විට එසේ කරගෙනයාමට ලබන වැඩය ගිනි පරිදි කිරීමට සහ ආරක්ෂා කිරීමට පමණක් නොව මහ ජන වත්කම්වල සහ කුඹුරු ඉඩකඩ අයිතිකරුවන්ගේ සහ අසලින් වැටී ඇති අවි පාරවල් පාවිච්චි කරන්නන්ගේද එසේම සාමාන්‍ය කරගෙන යනු ලබන යම්කිසි වැඩක නොවැලැක්විය හැකි හෝ සවර විධියේ හෝ දේපලක ආරක්ෂාව සලසන අන්දමින් සහ ශ්‍රී ලංකා ජනරජය මගින් අවශ්‍ය යයි නියම ලබන ලෙසින්ද යෝග්‍ය පරිදි අවහිරයක කිරීම, මඩ්ගන කිරීම, පලංචි බැඳීම, වේදිකා තැනීම, බ්‍රී දෙමීම, කුරුසා ගැසීම, මුල්තුං ගැසීම(අනිත් සහ බලයලත්තයන්ගේ ක්‍රියා කරන ) පොම්ප සැපයීම, වැට කණුවලු බැඳීම, දැන්වීම ගැසීම, දිවා රෑ ආලෝක කිරීම වැනි විධිවිධාන යෙදීම සහ ඒ සියල්ල ගත විධියෙන් නඩත්තු කිරීම කොන්ත්‍රාත්කරු විසින් තම වියදමින් කළ යුතුය. අවස්ථාවෝචිත පරිදි හෝ එසේ කිරීමට නියෝග කළ විට කොන්ත්‍රාත්කරු විසින් පූර්වෝක්ත ආවරණ කිරීම, මඩ්ගන කිරීම, පලංචි බැඳීම, වේදිකා බ්‍රී දෙමීම, කුරුසා මුල්තුං (අනිත් සහ බලයලත්තයන්ගේ ක්‍රියා කරන ) පොම්ප, වැට කණුවලු සහ දැන්වීම සියල්ලම හෝ ඉන් සමහරක් හෝ ඉවත් කළ යුතුය. එසේම වැඩපල කරගෙන යාමේදී අවහිරයකට භාජන වූ සියලු දේවල් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් මනාලෙසට එකඟ වන පරිදි පෙර සේම සකසා තැබිය යුතුය. සෑම වර්ගයකම කම්කරුවන් උපකරණ සහ ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

25. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් අනුමත කරනු ලැබුවද නොලැබුවද කොන්ත්‍රාත්තුව ගත පරිදි ඉටු කිරීමට අවශ්‍ය වන සියලුම ආවරණ කිරීම, මඩ්ගන කිරීම, පලංචි, වේදිකා බ්‍රී දෙමීම, යන්ත්‍ර සූත්‍ර , සාණු ඇමීම, උපකරණ යන්ත්‍රාගාර හෝ මෙවලම් ප්‍රමාණවත් පරිදි සැපයීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. එමෙන්ම කොන්ත්‍රාත්තුව අවසන් වන තෙක් එකී කාලය තුළ සිදුවිය හැකි සියලු අනතුරු හා අලාභ හානි ද දරා ගැනීම ඔහු සතු වන්නේය. වැඩට යොදවනු ලබන දෑ ප්‍රමාණවත් විය යුතු බව

26. (මෙහි පහත පලවෙන 30 වැනි වගන්තියේ සඳහන් පරිදි හැරාවැඩපොළේ ප්‍රයෝජනය පිණිස සහ එම වැඩ කැනීම, අවසන් කිරීම, හෝ නඩත්තු කිරීම සඳහා වැඩබිමටට හෝ වැඩපොළට තමා විසින් භාරදී ඇති සවර ද්‍රව්‍යයක් හෝ බඩු බාහිරාදියක්ද එසේම තමා විසින් භාරදී පවිතරය ලද හෝ තනන ලද යම්කිසි යන්ත්‍රාගාරයක් හෝ තාවකාලික නිර්මානයක් හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුගෙන් ලියවිල්ලකින් කලින් ලබාගත් අවසරය නැතිව භූමි භාගයෙන් ඉවත ගෙන නොයා යුතුය. නැතහොත් ගෙන යාමට තැත් නොකළ යුතුය. තවද කොන්ත්‍රාත්කරු විසින් යම්කිසි බඩු බාහිරාදියක් හෝ යන්ත්‍රාගාරයක් තාවකාලික නිර්මාණයක් හෝ රැගෙන යනු ලැබුවොත් හෝ රැගෙන යාමට තැත් කරනු ලැබුවොත් හෝ ඔහු විසින් මේ වගන්තිය කඩ කරනු ලැබූ බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් ලියවිල්ලකින් සහතික කරනු ලැබේ.(මේ සහතික මතාවසාන නිරණය රද පවසී) එසේම කොන්ත්‍රාත්කරු විසින් යම් කිසි බඩු බාහිරාදියක්, යන්ත්‍රාගාරයක් හෝ තාවකාලික නිර්මාණයක් රැගෙන යන ලදැයි හෝ රැගෙන යාමට තැත් කරන ලදැයි හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් ලියවිල්ලකින් කරනු ලබන සහතිකය, කොන්ත්‍රාත්කරු විසින් මේ වගන්තියද එමෙන්ම මේ කොන්ත්‍රාත්තුවද කඩකරනු ලබන්නේ හෝ ලැබූයේය යන්නට අවසාන සාක්ෂි වශයෙන් ගණන් ගනු ලැබේ. ද්‍රව්‍ය හෝ යන්ත්‍ර ඔබසර ගෙන නොයා යුතු බව

කොන්ත්‍රාත්තුව සපුරා ඉටුකිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වුවහොත් ඒ සියලුම බඩුබාහිර, යන්ත්‍රාගාර සහ තාවකාලික නිර්මාණ රාජ සන්තක වෙනු ඇත. එසේ වූ විට ඒ සියලුම බඩුබාහිර කොන්ත්‍රාත්කරුගේ හෝ ඔහුගේ උරුමක්කාර අද්මිනිස්ත්‍රාසි බලකාර හෝ බලය ලත් ලැබුම්කරුවන්ගේ කිසිදු ඉල්ලීමකට ඉඩ නොතබා අයත්කර ගැනීමට තබා ගැනීමට පාවිච්චි කිරීමට හෝ විකුණා දැමීමට ශ්‍රී ලංකා ජනරජයට හිමිකම් ඇත්තේය.

27. සෑම නිර්මාණයක් ම ඒ ඒ වැඩ අංගයට ගැලපෙන පරිදි ඉතා උසස් ශිල්පී තත්ත්වයකින් තිබිය යුතු අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුහට එකඟ යන පරිදි පිරිවිතුරුවල් මනා ලෙසක් විය යුතුය. කරන ලද යම් කිසි වැඩ කොටසක් හෝ කොටස් අසතුටුදායක බැව් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුහට හැඟී ගියහොත් එම කොටස හෝ කොටස් කොන්ත්‍රාත්කරුගේ වියදමින් ඉවත් කිරීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුහට බලය තිබේ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් ලියවිල්ලකින් අනුමති දීමෙන් පසු සතියක් ඇතුළත එම වැරදි නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වුවහොත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුහට හැඟීයන ඉතා හොඳම ක්‍රමයට එම වැඩ කරවීම සහ එම වියදම කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල් වලින් කපා ගැනීමට හෝ ගිනි මගින් අයකර ගැනීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුහට බලය තිබේ. වැඩවල තත්ත්වය



CamScanner

පාඨශාලා වැඩභාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා ස්ථානයේ සිටීම සහ ඔහුගේ පරිපාලනය නරක වැඩ කොටසකට හෝ පත්වීම සම්බන්ධ වගකීමකින් කොන්ත්‍රාත්කරුට මිදීමට කරුණක් නොවන බැව් සැලකිය යුතුය. පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාගේ නියම වලට පටහැනිව වන පරිදි කරන ලද කිසිදු වැඩක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවනු නොලැබේ. එමෙන්ම කොන්ත්‍රාත්කරුට ඒ සම්බන්ධයෙන් කිසිදු හිමිකමක් දැක්විය නොහැක.

**වැඩවල සම්පූර්ණත්වය පිළිබඳව වගකීම**

28. තමා විසින් කරන ලද සියලු වැඩවල නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය පිළිබඳව කොන්ත්‍රාත්කරු මුළුමනින්ම වගකිව යුතුවාක් මෙන්ම මෙහින් වෙනත් විසින් ගිය සිදුවිය හැකි සියලු වැරදි කාර්යතා සහ හානි කොන්ත්‍රාත්කරු විසින් තමාගේ ම වියදමින් හරිගැස්විය යුතුය.

වැඩ කරගෙන යන අවස්ථාවේ දී ඒ සඳහා ගෙනෙන ලද ද්‍රව්‍ය සම්බන්ධයෙන් හෝ තමා විසින් භාවිතා කරනු ලැබූ හෝ යොදවනු ලැබූ හෝ යොදවනු ලැබූ නිර්මාණ ක්‍රම සම්බන්ධයෙන් හෝ පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාගේ අනුමැතිය ලැබුණත් වී නමුත් නිර්මාණ අවස්ථාවේදී හෝ පවත්නා අවස්ථාවේදී හෝ එසේ කරනු ලැබූ වැඩ අඩුලුහුඬු වුවවත් ඒ පිළිබඳව කොන්ත්‍රාත්කරු සම්පූර්ණයෙන් වගකිව යුතුය.

**යම් වැඩකටම ඉතා හොඳම ද්‍රව්‍ය පාවිච්චි කළ යුතු බව.**

29. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු ඒත්තු ගන පරිද්දෙන් සියලුම වැඩ වෙනුවෙන් ම පාවිච්චි කරනු ලබන ඒ ඒ ද්‍රව්‍යවල තත්ත්වයෙදාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් තීරණය කරනු ලබන අතර කොන්ත්‍රාත්කරු විසින් එසේ අනුමත කරනු ලැබූ ද්‍රව්‍ය හැර අන් කිසිවක් පාවිච්චි නොකළ යුතුය. එසේ කරුණු සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ අදහස අවසාන තීරණය වන අතර කොන්ත්‍රාත්කරු එය පිළිපැදීමට බැඳී සිටී.පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු ඉල්ලූ කළ විටක කොන්ත්‍රාත්කරු විසින් කර්මාන්තයටභූමියට ගෙනෙනලද යම් කිසි ද්‍රව්‍ය තොගයක් පිළිබඳ අනුරූපත්විය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුහට ඒත්තුගන පරිදි තමා විසින් ප්‍රසිද්ධ නිෂ්පාදකයින්ගෙන් ලබාගෙන ඇති ඉන්වොයිසි, වවුචර ඉන්වොයිසි ආදිය. සාම්පල සහ ඒ බැව් ඔප්පු කරීමට අදාළ වන අනිකුත් ලියකියවිලි කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. ගොඩනැගිලි සෑදීම සඳහා පාවිච්චි කිරීමට සුදුසු/නොසුදුසු වන හෝ පාවිච්චි කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ උපකරණ පරීක්ෂණ ගාස්තු කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් වලින් අය කරනු ලැබේ.

**ප්‍රතික්ෂේප කරන ලද ද්‍රව්‍ය**

30. පිරිවිතරවල සහ/ හෝ වෙළඳ සාම්පලවල සඳහන් ද්‍රව්‍ය තත්ත්වයට වඩා පහළ හෝ එයි තත්ත්වයට වඩා අඩුවූ යම් කිසි ද්‍රව්‍යයක් කර්මාන්ත වැඩ සඳහා පාවිච්චි කර ඇති බැව් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුහට පෙනී ගියොත් එම නිලධාරියා විසින් ලියවිල්ලකින් නියෝග කළ විගස කොන්ත්‍රාත්කරු විසින් එම ද්‍රව්‍ය ගලවා කර්මාන්ත භූමියෙන් ඉවත් කොට ඒ වෙනුවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුට ඒත්තු යන ලෙස තමාගේ වියදමින් වෙනත් ද්‍රව්‍ය සවිකළ යුතුය.

**කර්මාන්ත භූමියේ තිබෙන ගල්,පස්,වැලි ආදිය සහ එබඳු ද්‍රව්‍ය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට ප්‍රයෝජන ගත නොහැකි බව.**

31. කර්මාන්ත භූමියේ තිබෙනවැලි, ගල්, මැටි පිරවීම, ද්‍රව්‍ය, පස්, ගල් සෑදීම කොන්ත්‍රාත්තුවේ වැඩ සඳහා භූමිය සැකසීමේදී අනුවන වෙන යම් දේ හෝ ද්‍රව්‍යයද කර්මාන්ත භූමියේ අයිතිය පවරාදෙන අවස්ථාවේ එහි තිබෙන ගොඩනැගිලි හෝ ව්‍යුහලෙසා ආදියද විකිණීමට හෝ තමාට අභිමත පරිදි ප්‍රයෝජනය කිරීමට හෝ කොන්ත්‍රාත්තුවේ වැඩක් සඳහා හැර තැනින් තැනට ගෙන යාමට හෝ කොන්ත්‍රාත්කරුට අයිතියක් නැත. ඒ සියලුම දේ ද්‍රව්‍ය ගොඩනැගිලි ව්‍යුහලෙසාදිය ශ්‍රී ලංකා ජනරජය සතු දේපල වන්නේය. එසේවුවද වුවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ ලිඛිතවිල්ලකින් ලබන ලද අවසරය ඇති ව එබඳුවනාදිය කොන්ත්‍රාත්කරුට කර්මාන්ත වැඩ සඳහා යොදාගත හැක.

**රන්,රිදී, ඛනිජ පුරාවිද්‍යා ද්‍රව්‍ය සහ අනෙකුත් එබඳු දේ**

32. කර්මාන්ත භූමිය තුළ හෝ පොළොව මතුපිට තිබී හමුවිය හැකි සියලු රන් රිදී සහ වෙනත් යම් ඛනිජ ද්‍රව්‍යද සෑම වර්ගයකට අයත් මැණික් ගල්, කාසි, සිඳත් පුරාවිද්‍යා ද්‍රව්‍ය හෝ අනිකුත් එබඳු ද්‍රව්‍යද ජනරජය සතු දේපල වශයෙන් සැලකිය යුතුය. එබඳු සියලු ද්‍රව්‍ය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුහට ඒත්තු යන පරිදි කොන්ත්‍රාත්කරු විසින් පුරැසිව තබා ගත යුතු අතර එම ද්‍රව්‍යභාර ගැනීමට වරින් වර ශ්‍රී ලංකා ජනරජයේ පත්කරනු ලබන අයට පවරා දියයුතුය.

33. පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාගේ අනුමැතිය නොමැතිව කිසිදු වැඩක් නොකළ යුතුය. කලින් ලබන ලද එබඳු අනුමැතියක් නොමැතිව කරන ලද වැඩ පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාට ඉවත් ලැයෙනන සහ අභිමත පරිදි පරීක්ෂා කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් යම් කිසි ප්‍රමාදයක්, අලාභයක් හෝ අමතර වියදමක් දැරීමට සිදුවුවහොත් ඒ සියලු වියදම් අලාභාදිය කොන්ත්‍රාත්කරු විසින් මුළුමනින්ම දැරිය යුතුය.

කර්මාන්ත වැඩ කරගෙන යන අවස්ථාවේදී හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් කාල පරිච්ඡේදයේ දී හෝ යම් කිසි වැඩක් කිසියාකාරව කර නැති බැව් පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාට පෙනී ගියොත් එය සඳහන් පරීක්ෂණය පැවැත්වීමට හැකි වන පරිදි ගොඩනැගිල්ලේ කිසියම් කොටසක් කඩා දැමීමට හෝ හාරා බැලීමට හෝ ඉවත් කිරීමට කොන්ත්‍රාත්කරුට අණකළ හැක. පාවිච්චි කරන ලද ද්‍රව්‍ය වල හෝ වැඩවල හෝ ඒ දෙවර්ගයේ ම හෝ දොස් ඇති බැව්



CamScanner

පරීක්ෂණයේ දී හෙළි වුවොත් එම පරීක්ෂණය සඳහා වැය වන මුළු වියදම් කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුය. තවද පාඨශාලා වැඩ පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයාට ඒත්තු යන පරිදි ඒ සියලු දොස් නිදොස් කොට කොන්ත්‍රාත්කරුගේ වියදමින් ම වැඩය අවසන් කළ යුතුය. එහෙත් එබඳු දොස් ඇති වුවොත් එම පරීක්ෂණය සඳහා වැය වන මුළු වියදම් ශ්‍රී ලංකා ජනරජය මගින් දරනු ඇත.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු යන මොවුන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට හෝ කොන්ත්‍රාත්කරුගේ වැඩ පොළේදී හෝ කර්මාන්ත භූමියේදී හෝ වෙන යම් තැනකදී හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය සහ එවැනට කරගෙන යන වැඩ පරීක්ෂා කිරීමට සෑම කල්හිම සෑම පහසුකම්ම සපයා තැබිය යුතුය.

34. කොන්ත්‍රාත්කරු විසින් වැඩ පරිපාලනය කිරීම සඳහා තමාගේ මුළු කාලය පුද්ගලික වශයෙන් යෙදිය යුතුය. නැතහොත්, පාඨශාලා වැඩ භාර උප පරීක්ෂකවරයාගේ නිර්දේශ පිළිගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකි, එවනු ලබන දැන්වීම් හෝ දැන්වීම් කොන්ත්‍රාත්කරු වෙනුවෙන් භාර ගැනීමට බලයලත් සුදුසු කළමනාකරුවෙක් හිමි බලය සහිතව කොන්ත්‍රාත්කරු විසින් පත්කර ගත යුතුය. **කොන්ත්‍රාත් කරු හෝ නියෝජිතයා සහ පරිපාලනය**

එම නියෝජිතයාගේ නම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු හට ලියවිල්ලකින් දැන්විය යුතුය.

වැඩය කරගෙන යන විට කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ නියෝජිතයා හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුගේ අවසරය කලින් ලබා නොගෙන වැඩපළට නොපැමිණීම හෝ මෙයට අමතර වශයෙන් වෙන යම් කොන්ත්‍රාත්තුවක නිරතවීම හෝ නොකළ යුතුය. ලියවිල්ලකින් එසේ අවසරයක් ලැබුණේ වී නමුදු කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ නියෝජිතයා හෝ නොපැමිණි කාලය තුළ හදිසි අන්තරාවක්, අනතුරක්, වැරැද්දක් හෝ තමා විසින් හෝ සිදුවුවහොත් ඒ සියල්ල සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිව යුතුය.

මෙහි 20 වැනි වගන්තියෙහි දැක්වෙන පරිදි කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයාට වෙනත් දේ අතර, බිම මට්ටම් කිරීම සහ වැඩ ආරම්භ කිරීම කළ හැකි විය යුතු අතර එබඳු වැඩ සම්බන්ධයෙන් ඔහු තුළ කලින් ලබන ලද පළපුරුද්දක් තිබිය යුතුය. වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කරන තෙක් නියෝජිතයා අස් නොකළ යුතුය.

මේ කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරගෙන යෑමට, රජයේ පොරොන්දු කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයෙහි දැක්වෙන අයෙකු කොන්ත්‍රාත්කරු විසින් පත්කර නොගත යුතුය.

35. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියලු දැන්වීම් කොන්ත්‍රාත්කරුට පුද්ගලික වශයෙන් හෝ ඔහුගේ නියෝජිතයාට හෝ (සමාගමක නම් ඒ සමාගමේ ඒජන්තට හෝ ලේකම්වරදා) භාර දුන් විට හෝ කොන්ත්‍රාත්කරු විසින් මේ කාරණය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද තමාගේ කාර්යාලීය හෝ නිවාස ලිපිනයට තැපෑලෙන් යැවූ විට හෝ ඒ දැන්වීම ඔහුට භාරදුන් ලෙසට ගණන් ගනු ලැබේ. තවද පූර්වෝක්ත කොන්ත්‍රාත්කරු තම කාර්යාලීය හෝ නිවාස ලිපිනය වෙනස් කරනු ලැබේ නම් ඒ බැව් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුට අනුමැදව ලියමනකින් දැන්විය යුතු බැව් මෙයින් එළිදරව් ලෙසම පොරොන්දු වනු ලැබේ. ලිපිනය එසේ වෙනස් කළ බැව් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ලිපියකින් දන්වන තෙක් කලින් දෙන ලද ලිපිනයටම සියලු ලිපුම්, දැන්වීම් හෝ ලියකියවිලි පෙරයෙහි තැපෑලෙන් යවනු ලැබේ. එසේ කිරීම කොන්ත්‍රාත්තුව සම්බන්ධ සියලු කටයුතු සඳහා ප්‍රමාණවත් බැව් ගණන් ගනු ලැබේ. **දැන්වීම් භාර දීම**

36. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ අනුමැතිය සහ බලය ලියවිල්ලකින් කලින් නොලැබ මේ කොන්ත්‍රාත්තුව යටතේ ඇති කොන්ත්‍රාත්කරුගේ වගකීම් හෝ අයිතිවාසිකම් තව කෙනෙකුට භාරදීම, පැවරීම හෝ අතුරු කොන්ත්‍රාත්තුවක් වශයෙන් දීම නොකළ යුතුය. **කොන්ත්‍රාත්තුව අතුරු බදු දීම**

37. යම්කිසි අතුරු කොන්ත්‍රාත්කරුවෙකු හෝ මේ වැඩ වෙනුවෙන් හෝ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් පත් කර ඇති හෝ යොදවා ඇති එබඳු වෙන යම් අයෙකු ගැන හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුගේ පැහැදීමක් නැති වුවොත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් ලියවිල්ලකින් නියෝගයක් කරනු ලැබුවහොත් කොන්ත්‍රාත්කරු විසින් එම තැනැත්තා/ තැනැත්තන් කොන්ත්‍රාත්තුවෙන් වහාම ඉවත් කළ යුතුය. නැතහොත් ඉන් අස් කළ යුතුය. **අතුරු කොන්ත්‍රාත් කරුවෝ**

38. මේ කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරු බාරයේ පවත්නා යම්කිසි භූමියකට හෝ කර්මාන්ත භූමියකට තම අභිමතය පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු වරින් වර පැමිණ මේ කොන්ත්‍රාත්තුවට ඇතුළත් නොවන යම්කිසි වැඩක් තමා විසින් හෝ තම ඒජන්ත මගින් හෝ වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු ලවා හෝ කරවිය හැක. එසෙනුදු වුවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් මේ බලය ක්‍රියා කරවීමේදී කොන්ත්‍රාත්කරුට යම් අලාභයක්, හානියක් සිදු වුවොත් ඒ බවට ඔහු විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු වෙත දැනුමක් කළ යුතුය. සිදු වූ හානිය පිළිබඳ අලාභය තම නිගමනය අනුව ගණන් බලා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු වෙත දැනුමක් කළ යුතුය. සිදුවූ හානිය පිළිබඳ අලාභය තම නිගමනය අනුව ගණන් බලා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන **අනෙකුත් ක්‍රියාකාරීත්වය**

අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් වරින් වර ශ්‍රී ලංකා ජනරජයට සහතික කළ යුතුය. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් එසේ සහතික කරනු ලැබූ යම් අලාභයක් ඇත්නම් ශ්‍රී ලංකා ජනරජය විසින් එය ගෙවිය යුතුය. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් හෝ වෙනුවෙන් එසේ කරනු ලැබූ අලුත් හෝ අතිරේක වැඩ නිසා අතිකුත් වැඩ නොකර හැර වගකීමෙන් නිදහස් වීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුවට මෙයින් ඉඩ නොසැලසේ.

කොන්ත්‍රාත්කරු සහ ඔහුගේ සේවකයන් එම වැඩ නිසි පරිදි නිම කිරීමට ඒ වෙනුවෙන් යොදවනු ලැබූ අයට/අයවලුන්ට හෝ කොන්ත්‍රාත්කරුට සෑම විටම සහයෝගය දැක්විය යුතුය.

අස්කර දැමීමට ඇති බලය

39. කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවා ඇති යම් කිසිවකු අදක්ෂ බැව් හෝ නුසුදුසු පරිදි කටයුතු කරන බැව් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට පෙනී ගියොත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් ඉල්ලීම් කළ විටක කොන්ත්‍රාත්කරු ඔහු අස්කළ යුතුය. එසේ අස්කර දැමූ අයකු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරය නොමැතිව නැවත වැඩට නොගත යුතුය.

ශ්‍රී ලාංකික කම්කරුවන් යෙදවිය යුතු බව.

40. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ශ්‍රී ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙන අතර, ඔවුනු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් විශේෂ අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් අනුමත කරන ලද ශ්‍රී ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ශ්‍රී ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

විග්‍රහය

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා ශ්‍රී ලාංකික යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකා ජනරජයේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙන් එකී පාඨයට ඇතුළත් වෙයි.

පොත්පත් පරීක්ෂා කිරීම

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලව ද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පඩිගොට්ටා වැන්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට ............................ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

කම්කරු වන්දි ඉල්ලීම

41. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත යටතේ හෝ එහි වෙනස්කරන ප්‍රතිශෝධනයක් හෝ වෙනත් කිරීමක් යටතේ හෝ සවර කම්කරුවෙකු සම්බන්ධයෙන් හෝ උද්ගත වන ඉල්ලීමක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු ශ්‍රී ලංකා ජනරජයට වන්දි ගෙවිය යුතුය. ශ්‍රී ලංකා ජනරජය මගින් එසේ ගෙවනු ලබන මුදල/මුදල් මේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති හෝ ගෙවිය යුතු මුදලකින් හෝ මේ ගිවිසුමේ 3 වැනි වගන්තිය යටතේ කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කරන ලද රුපියල්............................................................ (රු. ........................./......) ඇප මුදලින් හෝ කිසි මගින් හෝ අය කරගනු ලැබේ.

හදිසි අනතුරු සහ අලාභ හානි

42. (කොන්ත්‍රාත්කරු විසින් හෝ ශ්‍රී ලංකා ජනරජය මගින් හෝ වෙනයම් අයුරකින් හෝ) මේ වැඩ වෙනුවෙන් හෝ ඊට අදාළ වැඩක් වෙනුවෙන් හෝ යොදවා ඇති යම් කිසි පුද්ගලයෙකුට, සතෙකුට, මහජන හෝ පුද්ගලික මාර්ග, දේපළ, කර්මාන්ත, බඩු බාහිර, ද්‍රව්‍ය හෝ වෙන යම් දේකට හෝ හානියක්, විනාශයක් හෝ අවාලයක් සිදු වුවොත් ඒ සියලු හදිසි අනතුරු හෝ කැඩුම් බිඳුම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් උද්ගත විය හැකි සියලු නඩු පැවරීම්, අලාභ ඉල්ලීම්, හානි වියදම්, ගාස්තු සහ වියය කොන්ත්‍රාත්කරු බේරුම් කර ගත යුතුවා මෙන්ම ශ්‍රී ලංකා ජනරජය හා ශ්‍රී ලංකා ජනරජයේ සියලුම නිලධාරීන් හා සේවකයන් එබඳු වන්දි ඉල්ලීම් වලින් නිදහස් කළ යුතුය. යට දක්වන ලද පරිදි සිදු වූ යම් හදිසි අනතුරක් හෝ අලාභහානියක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වන්දි ගෙවනු නොලැබුවහොත්, නැතහොත් නිසි පරිදි ක්‍රියා කරනු නොලැබුවොත් හෝ යට දැක්වූ පරිදි උද්ගත විය හැකි සියලු නඩු පැවරීම්, අලාභ හා ඉල්ලීම්, අලාභහානි සහ වියහියදම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සතුටුදායක අන්දමින් ක්‍රියා නොකළොත් හෝ වන්දි නොගෙවුවොත් හෝ ශ්‍රී ලංකා ජනරජය විසින් සුදුසු නිලධාරියෙකු මගින් ඊට වන්දි ගෙවා හෝ සුදුසු පරිදි නිරාකරණය කොට, උද්ගත වී ඇති නඩු පැවරීම්, අලාභ ඉල්ලීම්, අලාභ හානි සහ වියහියදම් සතුටුදායක ලෙස බේරුම් කොට ශ්‍රී ලංකා ජනරජයට එසේ දැරීමට සිදුවූ සියලු වියදම් මේ ගිවිස්සාවේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති හෝ

ගෙවිය යුතු වන හෝ යම්කිසි මුදලකින් හෝ මුදල් වලින් හෝ මේ ගිවිස්සාවේ 3 වැනි නියමය අනුව කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කරන ලද ඇප මුදල වන රුපියල් (රු......................./.................) න් හෝ තවු මාර්ගයෙන් හෝ අය කර ගනු ලැබේ.

43. කර්මාන්ත වැඩ සඳහා භූමි භාගයට ගෙනෙන ලද සියලු බඩුබාහිර ඇතුලු කොන්ත්‍රාත්තුවේ සඳහන් ගොඩනැගිලි ආදිය කොන්ත්‍රාත්තුවේ නියමිත වැඩ අවසානයේදී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු හට භාර දෙන තෙක් කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ වගකීම පිට පවතී. යුධ බිය, කැරලි ගැසීම, භූමිකම්පා හැර ගින්නෙන්, පිපිරීමකින් ඇති වන හදිසි අනතුරු වලින්, කාලගුණය අනුව හට ගන්නා ජලගැලීම් වලින්, සොර සතුරන්ගෙන් හෝ වෙනත් එබඳු සියලු අනතුරු වලින් සිදුවිය හැකි අලාභහානි සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිව යුතු අතර ඒ සියලු අලාභහානි තමාගේ මුදල් වියදමින් ම යථා තත්ත්වයට පැමිණවීමද, සියලු වැඩ ප්‍රකෘති තත්ත්වයකින් සහ සෑම ආකාරයකින්ම අවසන් කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුවරුට භාරදීම ගැනද කොන්ත්‍රාත්කරු වගකිව යුතුය.

එමෙන්ම සියලු වැඩ අවසන් කොට පූර්වෝක්ත පරිදි භාර දෙන තෙක් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් තමාගේ පාලනය යටතට පමුණුවන ලද සියලු ඉඩම්වල ආරක්ෂාව සහ පුරක්ෂිතභාවය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිය යුතු වෙයි.

44. තවද (මේ ගිවිස්සාවේ නියමවල් සහ කොන්දේසිවලට යටත්ව) සියලුම අතිරේක වැඩ, අත්හැරුණු වැඩ සහ රේඛා චිත්‍ර සහ විශේෂ විස්තර පත්‍රිකාවල දක්වන ලද සහ විස්තර කරනු ලැබූ වැඩ සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන සියලුම වෙනස් කිරීම්ද යථා විධියෙන් කිරීමට සහ කරවා ගැනීමට ඉඩ සැලසීමට කොන්ත්‍රාත්කරු සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු අතර කරගත් ගිවිස්සාවෙන් පැහැදිලි ලෙස පොරොන්දු වුන ලැබේ.

තවද එසේ නියම කරනු ලබන යම්කිසි අතිරේක වැඩක් නිම කිරීම පිණිස කොන්ත්‍රාත්තුවේ සඳහන් සම්පූර්ණ වැඩ අවසන් කිරීමට නියම ඇති කාල සීමාව ප්‍රමාණවත් නොවේ නම් (එසේ අවශ්‍ය පරිදි) යුක්ති සහ හේතු සහගත ලෙස ගිවිස්සාවේ සඳහන් දින හෝ දිනයන් වෙනස් කොට අතිරේක කාලයක් දීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු මෙයින් පොරොන්දු වෙති.

වැඩ වෙනුවෙන් සහ සම්බන්ධයෙන් කරනු ලබන නිර්දේශ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට ලියවිල්ලකින් නිකුත් කරනු ලැබේ. එසේ නොමැතිව කරනු ලබන කවර වැඩක් වුවත් මුදල් ගෙවීම පිණිස පිළිගනු නොලැබේ. රේඛා චිත්‍රවල දක්වන ලද්දා වූ ද පරිමාණ පත්‍රයෙහි සහ වෙනසුම්වල විස්තර කර ඇත්තා වූ ද වැඩට අතිරේක වශයෙන් කිසිදු වැඩක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුගෙන් ලියවිල්ලකින් ලබන ලද අවසරය නොමැතිව නොකළ යුතුය.

44 - අතිරේක වැඩ, අත්හැරුණු වැඩ හා වෙනස් කිරීම

45. වැඩය පවත්නා කාලය තුළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් නියම කරනු ලබන පෝරමයෙහි (අවශ්‍ය සැක්ෂි සවිස්තර මිනුම්ද සමග) මෙහි 46, 47 සහ 48 වැනි වගන්තිවල දැක්වෙන පරිදි ඉකුත් වූ ලිත් මාසය තුළ කරන වැඩ ප්‍රමාණයද කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කළ දින පටන් එතෙක් කරන ලද මුළු වැඩ ප්‍රමාණයද දැක්වෙන සම්පූර්ණ බිල් පත්‍රයක් කොන්ත්‍රාත්කරු විසින් පිළියෙල කොට සෑම ලිත් මාසයක මුල් සතියේදී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට හෝ ඔහුගේ කාර්යාලයට භාර දිය යුතුය. තවද එම වැඩ අතිරේක වැඩ වශයෙන් ඉල්ලුම් කර ඇද්ද හෝ නැද්ද යනුද සඳහන් කළ යුතුය. කොන්ත්‍රාත්කරු ඒ ඒ අංශයනවල වටිනාකම හෝ මිල ඉල්ලුම් කොට ඉදිරිපත් කරන සෑම බිල් පත්‍රයකටම එකී අංශයන වෙනුවෙන් පරිමාණ පත්‍රයෙහි දී ඇති අංකය යෙදිය යුතුය. කොන්ත්‍රාත්තුව යටතේ කරන ලද කවර ආකාරයක වැඩක් සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකා ජනරජය වෙත ඉදිරිපත් කරන සෑම මුදල් ඉල්ලීමකදීම ඒ සෑම ඉල්ලීමක් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මාසික බිල් පත්‍රයෙහි සඳහන් කළ යුතුය. එසේ බිල් පත්‍රවල ඇතුලත් කර නොමැති කවර ඉල්ලීමකට වත් කොන්ත්‍රාත්කරුට කිසිදු ඉඩක් නොලැබෙන අතර එම බිල් පත් සහ එයට අදාළ විස්තර ඉහත දැක්වූ පරිදි යථා විධියෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට ඉදිරිපත් කරන තෙක් ඒ වෙනුවෙන් කිසිදු මුදලක් නො ලැබේ.

45 - කොන්ත්‍රාත්කරු විසින් කරනු ලබන වැඩ පිළිබඳ මාසික බිල් පත්‍රය

46. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති බිල් පත්‍රයෙහි අංශයන ද ඒ ඒ අංශයන වෙනුවෙන් දක්වා ඇති මිනුම් ද පාඨශාලා වැඩ භාර පරීක්ෂක/ උප පරීක්ෂකවරයා විසින් හරි වැරදි බැලිය යුතුයි. මිනිය හැකි සියලුම අංශයන වල වටිනාකම උපලේඛිත ගත ගාස්තු අනුව මැනීමෙන් ලබන ප්‍රමාණිත මිලට සරිලන පරිදි ගණන් බලනු ලැබේ. මිනිය නොහැකි සියළු අංශයන කොන්ත්‍රාත් ලියවිලි කොටසක් වශයෙන් ගැනෙන පරිමාණ පත්‍රයෙහි පොරොන්දුව එහි දක්වා ඇති මිළ ගණන් අනුව තක්සේරු කරනු ලැබේ. අතිරේක වැඩ, අත්හැරුනු වැඩ සහ වෙනස් කළ වැඩ මෙහි පහත දැක්වෙන පරිදි තක්සේරු කරනු ලැබේ. පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා පූර්වෝක්ත මිනුම් හරි වැරදි බලන දිනය සහ වේලාව දක්වා ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරුට( හෝ ඔහුගේ නියෝජිතයාට) පැය 24ක දැන්වීමක් කරනු ලැබේ. පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/ උප පරීක්ෂකවරයා පූර්වෝක්ත පරිදි හරි වැරදි බලන විට ඔහු සමග සිටීමට කොන්ත්‍රාත්කරුට නිදහස තිබේ.

46 - බිල් පත්‍රය බිල් පත්‍රවල අංශයද, අංශයන වල මිනුම් සහ එම අංශයන තක්සේරු කිරීම පිළිබඳ හරි වැරදි බැලීම. මිනිය නොහැකි අංශයන තක්සේරු කිරීම

කොන්ත්‍රාත්කරු හෝ (ඔහුගේ නියෝජිතයා පාඨශාලා වැඩ භාර උප පරීක්ෂකවරයා විසින් හරි වැරදි බලන විට ඔහු සමග නො සිටියොත් හෝ මග හැර සිටියහොත් උප පරීක්ෂකවරයා විසින් බැලූ හරි වැරදි අවසාන ගණන් මිනුම් ලෙසත් තීරණාත්මක ලෙසත් සලකනු ලැබේ. ප්‍රාදේශිය හෝ සිරිත් වශයෙන් හෝ පුරුද්දක් හෝ පවතින මිනුම් ක්‍රම තිබුණද මේ සම්බන්ධයෙන් ඉඩ දෙනු ලබනුයේ ශුද්ධ මිනුම් ගණන්වලට පමණය. යථා විදින් දැන්වීමක් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු (හෝ ඔහුගේ නියෝජිතයා) පූර්වෝක්ත පරිදි හරි වැරදි බලන විට පාඨශාලා වැඩභාර උප පරීක්ෂකවරයා සමග සිටියොත් ඒ සම්බන්ධයෙන් සිදුවන යම් විරුද්ධයක් හෝ හරි වැරදි බැලීමෙන් පසු පැය 24 ක් ඇතුලත අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාට ලියවිල්ලකින් දැනුම් දීම කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ නියෝජිතයා සතු යුතුකමකි. එබඳු විරුද්ධ හෝ වැරදීමක් සම්බන්ධයෙන් පැය 24 ක් ඇතුලත කරනු නොලබන කිසිදු ඉල්ලීමකට ඉඩ නොලැබෙන අතර පාඨශාලා වැඩභාර පරීක්ෂකවරයා/උප පරීක්ෂකවරයා විසින් හරි වැරදි බැලූ මිනුම් මිනුම් ගණන් අවසාන ගණන් ලෙසත් තීරණාත්මක ලෙසත් සලකනු ලැබේ. පාඨශාලා වැඩභාර පරීක්ෂකවරයා/උප පරීක්ෂකවරයා විසින් කරනු ලැබූ මිනුම් සම්බන්ධයෙන් යම් කිසි විරුද්ධ/වැරදි ගැන කොන්ත්‍රාත්කරු (හෝ ඔහුගේ නියෝජිතයා) පූර්වෝක්ත පැය 24 ඇතුලත අධ්‍යාපන අධ්‍යක්ෂට දැනුම් දුන්විට එහි වැරදි නිවැරදි බව පිළිබඳව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුට හා කොන්ත්‍රාත්කරුට එකඟ නොවිය හැකි වුවොත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ තීරණය මේ පිළිබඳව අවසාන තීරණය වන්නේය.

එසේවුද වුවත්, යම් කිසි මුදලක් වැඩිපුර ගෙවා ඇත්නම් හෝ රේඛා චිත්‍ර සහ වෙසෙසුම්වල දැක්වෙන පරිදි එම වැඩ හෝ එහි කිසිදු කොටසක් ක්‍රියාත්මක කර නැත්නම් හෝ නඩත්තුව පිළිබඳ කොන්දේසි ප්‍රකාර කටයුතු නොදා නැත්නම්, කොන්ත්‍රාත්කරුට එකඟ නොවිය හැකි වුවොත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ තීරණය මේ පිළිබඳව අවසාන තීරණය වන්නේය. හෝ නැත.

**අමතර වැඩ අතහැරුණු වැඩ සහ වෙනස් කළ වැඩ තක්සේරු කිරීම**

47. අමතර වැඩ සහ අතහැරුණු වැඩ පහත සඳහන් නීති අනුව තක්සේරු කරනු ලැබේ.

(අ). පරිමාණ පත්‍රයෙහි දැක්වෙන ගාස්තු ප්‍රමාණ අනුව එබඳු ආකාරයෙන් සහ එබඳු තත්වයන් යටතේ කරන ලද අතිරේක වැඩ තක්සේරු කරනු ලැබේ.

(ආ). කරන ලද අමතර වැඩ එබඳු ආකාරයකින් හෝ එබඳු තත්වයන් යටතේ නොවූ ඒවා නම් පූර්වෝක්ත ගාස්තු ප්‍රමාණ හැකි තරම් ප්‍රත්‍යක්ෂ පදනම අනුවින් තක්සේරුව සඳහා පදනම් කරගනු ලැබේ. එසේ කිරීමට අපහසු වුවහොත් ඒ කාලය තුළ එම ප්‍රදේශයේ එබඳු වැඩ සඳහා යන ගාස්තු ප්‍රමාණය පදනම් කරගනු ලැබේ.

(ඇ). අත්හැරුණු අංගය තක්සේරු කිරීම සඳහා පූර්වෝක්ත ගාස්තු ප්‍රමාණය පදනම් කරගනු ලැබේ. එසේවුද වුවත් අත හැරුණු වැඩ එයට වෙනස් තත්වයන් යටතේ කරනු ලැබූයේ නම්, එබඳු ඉතිරි අංගය සඳහාවූ ගාස්තු ප්‍රමාණ මෙහි (ආ) වගන්තිය යටතේ තක්සේරු කරනු ලැබේ.

මේ වගන්තිය යටතේ මාස් පතා ගණන් ගනු ලබන වැඩවල තක්සේරුව මෙහි 48 වැනි වගන්තිය යටතේ කරනු ලබන තක්සේරුව සහ ගෙවීම්වලින් අඩු කරනු ලැබේ. එසේ හෝ විට එකතු කරනු ලැබේ.

**ගෙවීම**

48. මේ ගිවිසුමේ 2 වැනි නියමයේ වෙනුවෙන් ගද මුදල හෝ පූර්වෝක්ත පරිදි එසේ ගෙවීමට සිදුවන වෙන යම් මුදලක් හෝ පහත සඳහන් පරිදි යථා විධියෙන් සහ අවශ්‍ය ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවීමට හෝ ගෙවීමට සැලැස්වීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන/ පාසැල් වැඩ ඉංජිනේරු මෙයින් බැඳී එකඟවී සිටී. එනම්:-

(ඒ). පාඨශාලා වැඩභාර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු උප පරීක්ෂකවරයා විසින් සහතික කරනු ලබන ලෙස වැඩ කෙරී යන පරිදි කොන්ත්‍රාත්කරුට මුදල් කොටස් වශයෙන් ගෙවනු ලැබේ. පාඨශාලා වැඩභාර පරීක්ෂකවරයා/උප පරීක්ෂකවයා මේ සහතික මින් පසු අන්තර් සහතික වශයෙන් හඳුන්වනු ලැබේ.

(බී). පූර්වෝක්ත පරිදි ගෙවිය යුතු ගණන වශයෙන් මැනීමෙන් හෝ වෙනයම් ක්‍රමයකින් හෝ ලබා ගන්නාවූද උප ලේඛන ගත ගාස්තු ප්‍රමාණ අනුව කරනු ලැබූවාවූද වැඩවල මුළු වටිනාකමින් මෙහි පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා ජනරජය වෙත රඳවා ගනු ලබන මුදල අඩු කොට පසු වන මුදල වන්නේය.

(සී). එසේ ශ්‍රී ලංකා ජනරජය වෙත රඳවා ගනු ලබන මුදල යථා විධියෙන් කරනු ලැබූ වැඩවල වටිනාකමින් සියයට 10 ක් වෙයි. ඉන්පසු පාඨශාලා වැඩ සහතික කරනු ලැබේ.

(ඩී). පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුට ඒත්තු යන පරිදි සියලුම වැඩ කොන්ත්‍රාත්තුවේ නියම පරිදි අවසාන කරන තෙක් ද ඒ සියළු වැඩ වෙනුවෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් (මින් පසු සම්පූර්ණ කිරීමේ සහතිකය' යනුවෙන් හඳුන්වනු ලබන) වැඩය සම්පූර්ණ කළ විට මුදල් ගෙවීමේ සහතිකය නිකුත් කරන තෙක් ද පූර්වෝක්ත මුදල වැඩය මනාව සම්පූර්ණ කරනු සඳහා ඇපයක් වශයෙන් ශ්‍රී ලංකා ජනරජය වෙත රඳවා ගනු ලැබේ.



CamScanner

ඊට පසු එසේ රඳවා ගනු ලබන මුදලින් භාගයක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඉතිරි භාගය අවසන් සහතිකය නිකුත් කරන තෙක් පෙර පරිදි රඳවා ගනු ලැබ අනතුරුව කොන්ත්‍රාත්කරුට ගෙවනු ලැබේ. වැඩ සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් නිකුත් කරනු ලබන අවසාන ගෙවුම් සහතිකය සම්පූර්ණ කිරීමේ සහතිකය වෙයි.

(ඊ). පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් සම්පූර්ණ කිරීමේ සහතිකය නිකුත් කළ විගස ම ඔහු විසින් එම වැඩ භාර ගත යුතුය. එසේවුද වුවත්, සතුටට පිළිගත හැකි සහ කොන්ත්‍රාත්තුවේ නියම පරිදි අවසන් නොව ඇති යම්කිසි වැඩක් කොටස් වශයෙන් තම අභිමතය පරිදි භාර ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුට බලය තිබේ.

(උ). ශ්‍රී ලංකා ජනරජය මගින් කලින් ඒ ගොඩනැගිලි ආදියට ඇතුල් වනු හෝ ඒවා භාර ගනු ලැබුවද එසේ හෝ එහි යම්කිසි කොටසක් වැඩට යොදාගනු හෝ පාවිච්චි කරනු ලැබුවද මෙහි 63 වැනි වගන්තියෙහි දැක්වෙන පරිදි සහ මේ ගිවිසුමේ දැක්වෙන ප්‍රකාරයට කොන්ත්‍රාත්කරු විසින් නඩත්තු කාලපරිච්ඡේදය තුළ එම වැඩ නිසි පරිදි නඩත්තු කළ හැටියට (මින් පසු මෙහි අවසන් සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන) සහතිකයක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් අත්සන් කරන තෙක් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් නොකළ හැටියට ගණන් ගනු ලැබේ. තවද පූර්වෝක්ත වැඩ හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වංචාවක්, වංචාකාරී හෝ වංචා සහගත සැඟවීමක් සිදුවී ඇත්නම්ද ප්‍රමාණවත් පරිදි කරනු ලැබූ පරීක්ෂණයකින් පසු එහි වැඩ හෝ ද්‍රව්‍ය සම්බන්ධ දෝෂයක් හෝ අඩුවක් හෙළිවී ඇත්නම්ද එසේ නිකුත් කරනු ලබන අවසන් සහතිකය එකී වැඩ පිළිබඳ ප්‍රමාණවත් බවට තීරණාත්මක සාක්ෂියක් වශයෙන් සලකනු ලැබේ.

(ඌ). පූර්වෝක්ත පරිදි හැර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් හෝ පාඨශාලා වැඩ භාර පරීක්ෂකවරයා/උප පරීක්ෂකවරයා විසින් හෝ නිකුත් කරනු ලබන කිසිදු සහතිකයක් පූර්වෝක්ත වැඩ හෝ ද්‍රව්‍ය සම්බන්ධ තීරණාත්මක සාක්ෂියක් වශයෙන් සලකනු නො ලැබේ.

49. (මින්මතු 'නියමිත දිනය' යනුවෙන් හඳුන්වනු ලබන) මේ ගිවිසුමේ 1 වැනි නියමයේ සඳහන් දිනට කොන්ත්‍රාත්කරු විසින් සියළු බාහිර සහ නිර්මාණ වැඩ නිමවා, උපකරණ සවිකොට හෝ සකසා අවසන් කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුට භාර දිය යුතුය. එසේම මෙහි සඳහන් කරන අවස්ථාවන්හිදී හැර අන් කුමන අවස්ථාවකදී හෝ වැඩය අවසන් කළයුතු දිනය දීර්ඝ කිරීමක් හෝ වෙනස් කිරීමක් කරනු නොලැබේ. **අවසන් කිරීමේ දිනය**

එසේවුද වුවත් යම්කිසි හේතුවක් නිසා වැඩය අවසන් කිරීම පමා වුවහොත් එනම්, මුලින සැලැස්මේ වෙනස් කිරීමක් නිසා හෝ යම් කිසි වැඩක් වෙනත් ආකාරයකින් කැනීමට, වෙනස් කිරීමට, ආදේශ කිරීමට, එසේ නැත්නම් අතිරේක වැඩක් කිරීමට හෝ අතිරේක වැඩක් කිරීමට හෝ අතිරේක ද්‍රව්‍ය සැපයීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් අණකිරීම නිසා හෝ යම් කිසි වැඩක් හෝ ද්‍රව්‍යයක් අසාර්ථ දැමීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් අණකිරීම නිසා හෝ කොන්ත්‍රාත්කරුගේ සාමිකරුවන් වැඩ වර්ජනය කිරීම හෝ වැඩ කරන භූමියෙන් දොට්ට දැමීම නිසා හෝ, කොන්ත්‍රාත්කරුට භූමි භාගය හෝ එහි යම්කිසි කොටසක් පවරා නොදීම නිසා හෝ මෙහි හෝ වෙනත් තැනක දැක්වෙන බලතල යටතේ ශ්‍රී ලංකා ජනරජය විසින් එම භූමි භාගය හෝ එම වැඩ වල යම්කිසි කොටසක් හෝ අත්හැර ගෙන යම් කිසි කොටසක් හෝ එම වැඩය හෝ ශ්‍රී ලංකා ජනරජය මගින් කළයුතු වැඩ කොටස නොකර පාවිච්චියට යොදා ගැනීම නිසා හෝ, කොන්ත්‍රාත්කරුට යම්කිසි නියෝගයක්, සැලසුම් උපදෙස් හෝ නිර්දේශ යථා කාලයේදී නොලැබීම නිසා හෝ ගින්න, විෂම කාලගුණය හෝ බලාපොරොත්තු රහිත හේතු නිසා වැඩ තාවකාලිකව නතර කිරීමට සිදුවීම නිසා හෝ (තවද එබඳු සිදුවීමක් ශ්‍රී ලංකා ජනරජයේ හෝ ශ්‍රී ලංකා ජනරජයේ සේවයේ වන හෝ නොවන කෙනෙකුගේ ආඥාවක් හෝ අත්හැර දැමීමක් නිසා හෝ වුවද) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුගේ සතුටට මැනවයි හැඟී නියෝග එකෙනෙහිම හෝ පසුව හෝ වරින් වර අභිමතය පරිදි එසේ කල්දීම සතුටට මැනවයි හැඟී වැඩය අවසාන කිරීමට නියමිත දිනය හෝ කල්දී ඇති දිනය ඉකුත්ව ඇත්තේ නමුදු හෝ තම හෝ වැඩය අවසාන කිරීමට නියමිත දිනය හෝ වැඩය අවසන් කිරීම සඳහා කල් දිනයක. එසේවුද උවත් අත්සන සහිත ලියවිල්ලකින් වැඩය අවසන් කිරීම සඳහා ප්‍රමාදය සිදුවෙමින් පැන හෝ සිදු වියහැකි බව දැනගත්විට හෝ ඊට කලින් ඒ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාදය සිදුවෙමින් යන හෝ සිදු වියහැකි බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් ඉංජිනේරු වෙත ලියවිල්ලකින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ හට දන්වා නැත්නම්ද, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් කල්දී ඇත්නම්ද ඉහත සඳහන් හෝ වෙන තවත් හේතුවක් නිසාවත් නියමිත කාල සීමාව දීර්ඝ කරනු නොලැබේ.

50. මෙහි 40 වැනි වගන්තියේ නියමිත කාලය තුළදී හෝ, වැඩ පෝරණය යන විට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු විසින් විධාන කරනු ලැබූ අතිරේක වැඩ සඳහා දෙනු ලැබූ අතිරේක කාලය තුළදී හෝ නොවැළැක්විය හැකි හේතු නිසා හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරුට දන්වන ලද හෝ **නියමිත කාලය තුළ වැඩ අවසන් නොකිරීම නිසා අලාභ ගෙවීම**

පෙනී ගිය වෙන යම් සාධාරණ යුතු හේතුවක් නිසා දීර්ඝ කරනු ලැබූ කාලය තුළදී හෝ වැඩය අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වුවහොත් පොරොන්දුවේ නියම කරගත් දිනයෙන් පසු පැමිණෙන අවසර පරිදි දීර්ඝ කරනු ලැබූ අවසාන දිනයෙන් පසු පැමිණෙන සෑම දිනක් පාසා හෝ ගණන් පියවීමෙන් පසු ගෙවිය යුතු අලාභය වශයෙන් ගණන් බලා ඇති රුපියල් ........................................
(රු.................../.............) ශ්‍රී ලංකා ජනරජය උදෙසා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට ගෙවිය යුතුය. තවද යට දැක්වෙන ලද පරිදි දිනකට ගෙවිය යුතු මුදල වන රුපියල් ..............................................(රු.........../...................) කොන්ත්‍රාත්කරු වැඩ පැහැර හැරීමේ හේතුවෙන් ශ්‍රී ලංකා ජනරජයට දැරීමට සිදුවූ නියම අලාභයේ පූර්ව ඇස්තමේන්තුවක් වශයෙන් සැලකීමට මෙයින් හෙළිදරව් ලෙසම එකඟ වනු ලැබේ. එසේම එකී මුදල සියලු කටයුතු සඳහා ගණන් පියවීමෙන් පසු ගෙවිය යුතු අලාභ වශයෙන් මිස දඩයක් වශයෙන් සලකනු නොලැබේ. එහෙයින් මේ කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති හෝ ගෙවිය යුතු යම් කිසි මුදලකින් හෝ මුදල්වලින් සහ/හෝ මේ ගිවිසුමේ 3 වැනි නියමය යටතේ කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කරන ලද රු.............................. (රු......................./...................) ක් හෝ ඒ සඳහා ලැබිය යුතු මුදල අඩුකර, රඳවා ගැනීමට සහ /එකී මුදල නඩු මගින් අයකර ගැනීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට නිදහසේ ඉඩ තිබේ.

**කොන්ත්‍රාත්කරු වස්තු භංගත්වයට පත්වීම.**

51. කොන්ත්‍රාත්කරු වස්තු භංගත්වය ප්‍රකාශ කළහොත් හෝ උසාවිය මගින් ඔහුගේ ගනුදෙනු බේරා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට වස්තු භංගත්වය පිළිබඳ අධිකරණ බලය ඇති උසාවියකින් ඉල්ලුම් කළහොත් හෝ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට පූර්ව ඔහුගේ ණයකාරයන් සමග සම්මුතියකට එළැඹීමට සූදානම් කර ගත්තොත් හෝ ඒ එසැණින් මේ කොන්ත්‍රාත්තුව අවසන් බව මෙයින් හෙළි දරව් ලෙස ම එකඟ වනු ලැබේ. එසේම පූර්වෝක්ත ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් අනුමැදුව තම භාරයට ගෙන එම වැඩ සම්පූර්ණයෙන් අවසාන කිරීමට වෙන කොන්ත්‍රාත්කරුවෙකුට පැවරීම හෝ කොන්ත්‍රාත්කරුගේ වියදමින් හෝ වස්තු භංගත්වයට පැමිණි ඔහුගේ බූදලයේ වැයෙන් හෝ එම වැඩ සම්පූර්ණ කොට අවසන් කිරීමට කම්කරුවන්, ශිල්පීන්වරුන් සහ ද්‍රව්‍ය සොයවා තම විසින්ම කරවීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට නිදහසේ බලය තිබේ. ගිවිසුමේ එසේ එවැනි හේතු නිසා අවසන් කිරීමට සිදුවුවහොත් කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට, එසේ අවසන් කිරීම නිසා වන්දි ඉල්ලීමට හිමිකම් නැත්තේය. නමුත් මේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් හෝ වස්තු භංගත්වයට පැමිණි ඔහුගේ බූදලයෙන් හෝ ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු කිසියම් මිල මුදලක් ඇත්නම් එයට යටත් කොට ගිවිසුමේ අවසන් කළ දින පෙන් කරන ලද වැඩවලට මුදල් ලබාගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් තිබේ. තවද මේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති හෝ ගෙවිය යුතු වන යම්කිසි මුදලකින් හෝ මුදල් වලින් හෝ මේ ගිවිසුමේ 3 වැනි නියමය යටතේ කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කරන ලද රුපියල් ..............................................................................................
(රු................................../......................) ක් හෝ පූර්වෝක්ත වැඩ සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන මුදල/මුදල් කපා ගෙන රඳවා ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට නිදහසේ ඉඩ තිබේ. එසේද වුවත් මේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු යම්කිසි මුදලක් කොන්ත්‍රාත්කරුගේ හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ නඩු මගින් ලබාගැනීමට ශ්‍රී ලංකා ජනරජයට ඇති හිමිකම් මෙයින් අවලංගු නොවේ.

**කොන්ත්‍රාත්කරු ගේ මරණය සිදුවීම හෝ හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම හෝ සමාගම ගණන් බේරා වසා දැමීම.**

52. පූර්වෝක්ත වැඩ අවසන් කිරීමට පළමු කොන්ත්‍රාත්කරුගේ මරණය සිදුවුවහොත් හෝ හවුල් ව්‍යාපාරය විසුරුවා හැරියොත් හෝ සමාගම ගණන් බේරා වසා දැමුවොත් හෝ පූර්වෝක්ත ..................
.................................. ගිවිසුම එසැණින්ම අවසන් වන බවට මෙයින් හෙළිදරව් ලෙස එකඟ වන අතර එම වැඩ තම අතට ගෙන එකී වැඩ අවසන් කිරීම පිණිස එය වෙන කොන්ත්‍රාත්කරුවෙකුට පැවරීමට හෝ ප්‍රමාණවත් පරිදි කම්කරුවන්, ශිල්පීන්වරුන් හෝ ද්‍රව්‍ය සොයවා තම විසින්ම කරවීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට ඇති හිමිකම් මෙහි ඇතුළත් කිසිවක් නිසාවත් අවලංගු නොවේ. එසේම, කොන්ත්‍රාත්කරුගේ මරණය සිදුවූ හෝ හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිය හෝ සමාගම ගණන් බේරා වසා දැමූ හෝ අවස්ථාවේදී මේ කොන්ත්‍රාත්තුවේ නියම සහ කොන්දේසි යටතේ ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු යම්කිසි මුදලක් වේ නම් එම මුදල ශ්‍රී ලංකා ජනරජයේ හිමිකම් වලට අගති විරහිත ව පූර්වෝක්ත කොන්ත්‍රාත්කරු වන.............................................................. ගේ බූදලයෙන් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ අයකර ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/පාසැල් වැඩ ඉංජිනේරු හට නිදහසේ අවසර ලැබේ.

මේ ගිවිසුමේ එබඳු ආකාරයකින් අවසන් කිරීමට සිදුවුවහොත් පූර්වෝක්ත.............. .................................. ගේ නීත්‍යානුකූල නියෝජිතයාට වන්දි ඉල්ලීමට හිමිකම් නොලැබෙන නමුත් මේ ගිවිසුමේ නියම සහ කොන්දේසි ප්‍රකාර එකී............................................................
.................................................................................................... ගෙන් හෝ ඔහුගේ බූදලයෙන්

හෝ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු සියලු හිමිකම් වලට යටත් කොට කොන්ත්‍රාත්කරුගේ මරණය සිදුවූ හෝ හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිය හෝ සමාගම ගණන් බේරා වසා දැමූ හෝ දින සේ කරන ලද වැඩවලට මුදල් ඉල්ලීමට ඔහුට හිමිකම් ඇත්තේය. තවද මේ ගිවිසුමට යටත් එයි........................ ........................................ට හෝ ඔහුගේ මුදලට හෝ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ ගෙවියයුතු මුදලකින් හෝ මුදල්වලින් හෝ මේ ගිවිසුමෙන් තුන් වැනි නියමය යටත් එයි ..............................................................................විසින් සැප්පත් කරන ලද රුපියල්.............................................................................................................
(රු...................................../.............) ක් හෝ ශ්‍රී ලංකා ජනරජයට ගෙවිය යුතු මුදල සහා, සහර කර ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුට බලය තිබේ.

එසේ නමුදු වුවත්, මේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු හිමිකම් මුදලක් එයි...............................................................ගෙන් හෝ .ඔහුගේ මුදලෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ අයකර ගැනීමට ඇති බලය මෙයින් අවලංගු නොවේ.

53. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් සම්පූර්ණ කිරීමේ සහතිකය නිකුත් කළ වහාම එදින සිට මාස ...............................................ක කාල පරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරු විසින් එම වැඩ නඩත්තු කිරීමට බැඳී සිටී. අයහපත් ද්‍රව්‍ය පාවිච්චි කිරීම නිසා හෝ වැඩ කරන් විම නිසා දෝෂ ඇති වුවහොත් කොන්ත්‍රාත්කරු විසින් එම වැඩ නොමිලේ අත්හැර වෙනත් වැඩකොටස් සෑදිය යුතුය. එසේම නඩත්තු කාල පරිච්ඡේදය තුළ සුළඟක්, සැඩැල්ලක් හෝ භූමිකම්පාවකින් හැර නිත්‍යයෙන් පිපිරීමකින් හට ගන්නා හදිසි අනතුරකින්, සතු ගුණය අනුව හට ගන්නා ජල ගැලීම් වලින් සහ අනෙකුත් එබඳු ආරක්ෂණය කළහැකි අනතුරකින් වැඩවලට සහ/ හෝ ද්‍රව්‍ය වලට සිදුවන අලාභ හානි වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වග කිව යුතු අතර ඒ සියලු අලාභ හානි තමාගේ වියදමින් කොන්ත්‍රාත්කරු යථා තත්ත්වයට පැමිණවිය යුතුය. නඩත්තුව

54. අවසාන සහතිකය නිකුත් කිරීමට ප්‍රථම වැඩ සොයාගෙන යන විට හෝ වැඩ අවසන් කිරීමට නියමිත දිනට පසුව හෝ යම්කිසි වැඩක් හෝ වැඩ කොටසක් සම්බන්ධයෙන් අලුත් වැඩියා කිරීමක් අවශ්‍ය වන බැවින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුතුමාට හැඟී ගොස් ඒ බවට කොන්ත්‍රාත්කරුට දින හතක දැන්වීමක් කළ පසු කොන්ත්‍රාත්කරු එය කිරීමට ප්‍රතික්ෂේප කළොත් හෝ නිසි අවධානයක් නැතිව එය පැහැර හැරිය හොත් හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් තමාට මැනවැයි සිතන පිළිවෙළකට එම වැඩය කරවා එය කොන්ත්‍රාත්කරුගේ වියට දමා ඔහුට ගෙවීමට ඇති හෝ ගෙවිය යුතු වන යම්කිසි මුදලකින් කපා ගනු ලැබේ. එසේ නැතහොත් එයි මුදල නඩු මඟින් අයකර ගනු ලැබේ. අලුත් වැඩියාව ප්‍රතික්ෂේප කිරීම

55. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ මතය සහ තීරණය අනුව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අහෝසි කිරීමට ඇති බලය

(ඒ). පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු විසින් නියම කරනු ලබන කාලයේදී හෝ ආකාරයට වැඩ ආරම්භ කරනු නොලැබුවේද

(බී). කොන්ත්‍රාත්තුව පවත්නා කාලය තුළදී හෝ වැඩ අවසන් කිරීමට කලින් නියම කරගත් හෝ පසුව කල් දෙනු ලැබූ දිනට පෙර හෝ පසුව කොන්ත්‍රාත්කරු නිසි අවධානය යොමු නොකරනු ලැබේද නැතහොත් ඔහුගේ වැඩවල පිළිගත හැකි ප්‍රගතියක් දක්නා නොලැබේද

(සී). නියමිත හෝ ආලේඛිත කාලය තුළදී වැඩ අවසන් කරනු නොලැබේද

(ඩී). පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුගේ නියමය හෝ දැන්වීම් අනුව නිසි අවස්ථාවලදී කටයුතු කරනු නොලැබේද

(ඊ). ජේඛා චිත්‍ර, වෙසෙසුම් සහ මේ කොන්දේසි අනුව වැඩ කරනු හෝ කරගෙන යනු නොලැබේද

(එෆ්). පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු තෘප්තිමත් වන අන්දමින් හෝ ඔහු විසින් විධාන කරනු ලැබූ ප්‍රකාරයට වැඩ අවසන් කිරීම, නඩත්තු කිරීම හෝ නඩත්තුව පවත්වාගෙන යාම කරනු නොලැබේද

(ජී). කොන්ත්‍රාත්තුව අතහැර යනු ලැබේද

(එච්). මේ කොන්ත්‍රාත්තුව යටතේ තමා කෙරේ පැවරී ඇති කවර හෝ වගකීමක් ක්‍රියාත්මක කරනු හෝ ක්‍රියාත්මක කිරීම පැහැර හරිනු ලැබේද

(අයි). වැඩවලින් හෝ කර්මාන්ත භූමියෙන් කිසියම් ද්‍රව්‍යක් හෝ යන්ත්‍රයක් ඉවත් කොට යනු හෝ ගෙන යාමට භාර කරනු ලැබේද

එම වැඩය නිසි පරිදි සහ යෝග්‍ය අන්දමින් කර ගෙන යාමට කොන්ත්‍රාත්කරුට ලියවිල්ලකින් දැනුම් දීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරුතුමාට හිමිකමක් බලය තිබේ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසැල් වැඩ ඉංජිනේරු තෘප්තිමත් වන පරිදි පූර්වෝක්ත වැඩ නිසි පරිදි සහ යෝග්‍ය අන්දමින් කිරීමට කොන්ත්‍රාත්කරුට ලියවිල්ලකින් දන්වා දින හතක් ගතවූ පසුත කොන්ත්‍රාත්කරු වැඩ අපහසු කරනු ලැබුවහොත්, කොන්ත්‍රාත්කරුට ලියවිල්ලකින් අනුමැදව දන්වා කොන්ත්‍රාත්තුව අවලංගු කොට එම සියලු වැඩ තමා අතට ගෙන ඒ වැඩ සම්පූර්ණ කොට අවසන් කිරීම සඳහා එයි කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙන කොන්ත්‍රාත්කරුවෙකු

යෙදවීමට හෝ ප්‍රමාණවත් පරිදි කම්කරුවන්, මේස්තිරිවරුන් සහ ද්‍රව්‍ය යොදවා තමා විසින් ම යෙදවීමට හෝ ප්‍රමාණවත් පරිදි කම්කරුවන්, මේස්තිරිවරුන් සහ ද්‍රව්‍ය යොදවා තමා විසින් ම කරවීමට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුවට නීතියෙන් බලය තිබේ. එබඳු අවස්ථාවක් පැන නැගුනහොත් යට දක්වන ලද පරිදි පූර්වෝක්ත වැඩ සම්පූර්ණ කොට අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජයට වැය වන මුදල හෝ මුදල් මේ කොන්ත්‍රාත්තුව අනුව කොන්ත්‍රාත්කරු වැඩ අවසන් කළේ නම් ඔහුට ශ්‍රී ලංකා ජනරජයෙන් ගෙවිය යුතු මුදල්වලට වැඩි කොට කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට සිදුවනු ඇත. කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට එකඟවූ සහ නියමවූ දින ඉකුත්වූ පසු පැමිණෙන සෑම දිනයක්මනා හෝ අවසර පරිදි කල් දැමූ අවසාන දිනය ඉකුත් වූවායින් පසු එකී කොන්ත්‍රාත්කරුගේ වියදමින් පූර්වෝක්ත වැඩ සම්පූර්ණ කර අවසන් කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් වෙන කොන්ත්‍රාත්කරුවන් යොදවා හෝ ප්‍රමාණවත් පරිදි කම්කරුවන්, මේස්තිරිවරුන් සහ ද්‍රව්‍ය යොදවා තමා විසින්ම වැඩ කරවා අවසන් කරන තෙක් හෝ ගතවන සෑම දිනක් පාසා කොන්ත්‍රාත්කරු විසින් (රු.........................................../...........) බැගින් ගණන් පියවීමෙන් පසු ගෙවන අලාභය හැටියට පූර්වෝක්ත ගණන් වලට අමතර වශයෙන් ශ්‍රී ලංකා ජනරජයට ගෙවිය යුතුය. එසේ හෙත් මේ වගන්තිය යටතේ කොන්ත්‍රාත්තුව අවලංගු කළ දින සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරු විසින් පූර්වෝක්ත වැඩ සම්පූර්ණ කොට අවසන් කිරීම සඳහා වෙන කොන්ත්‍රාත්කරුවෙකු යෙදවීම කළ හෝ ප්‍රමාණවත් පරිදි කම්කරුවන් මේස්තිරිවරුන් සහ ද්‍රව්‍ය යොදවා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුතුමා විසින්ම වැඩ ආරම්භ කළ දින අතර කාලය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගේ අලාභ ඉල්ලීමක් කරනු නොලැබේ.

තවද කොන්ත්‍රාත්කරු වැඩ පැහැර හැරීමේ හේතුවෙන් දිනකට රුපියල් ........................................................ (රු .........................................../...................) වන සේ ගෙවියයුතු මුදල ඇත්ත වශයෙන් සිදුවූ අලාභය වෙනුවෙන් කරන ලද යුක්ති සහගත පූර්ව ඇස්තමේන්තුවක් වශයෙන් සැලකීමට මෙයින් විධිදරුවී ලෙසම එකඟවන අතර මේ පිළිබඳ සියලු කරුණු සඳහා එම මුදල ගණන් පියවීමෙන් පසු ගෙවිය යුතු අලාභ වශයෙන් මිස දඩයක් ලෙස සලකනු නොලැබේ.

තවද පූර්වෝක්ත වැඩ අවසන් කිරීමටඅවශ්‍ය වන සම්පූර්ණ මුදල හෝ මුදල්ද, ගණන් පියවීමෙන් පසු අලාභය වශයෙන් අයවිය යුතු සම්පූර්ණ මුදල හෝ මුදල්ද මේ කොන්ත්‍රාත්තුව යටතේ හෝ වෙනත් ආකාරයකින් හෝ කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති හෝ ගෙවිය යුතු වන මුදලකින් හෝ මුදල්වලින් හෝ මේ ගිවිසුමේ 3 වැනි නියමය යටතේ කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කරන ලද රුපියල්.................................................................... (රු................................../.............) ක් හෝ සහා ගෙන තබා කර ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ පාසල් වැඩ ඉංජිනේරුවට නීතියෙන් බලය තිබේ.

එසේවුව ද, මෙහි ඇතුලත් වන කිසිවක් නිසාවත් මේ ගිවිසුමේ කොන්දේසි යටතේ තවදුරටත් ශ්‍රී ලංකා ජනරජයට අයවිය යුතු කිසියම් මුදලක් හෝ මුදල් කොන්ත්‍රාත්කරුගෙන් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් අයකර ගැනීමට ශ්‍රී ලංකා ජනරජයට ඇති බලය මෙයින් අවලංගු නොවේ.

56. ගිවිසුම් පත්‍රයේ 46වන ඡේදයේ දක්වන පරිදි සියළුම ස්ථානවල සඳහන් වන සහාය පාඨශාලා ගොඩනැගිලි පරීක්ෂක යන වචනය " සහාය පාඨශාලා ගොඩනැගිලි පරීක්ෂක" හෝ වෙනත් ඔහට ලත් නිලධාරියෙක් හැටියට කියවිය යුතුයි.

57. සෑම කම්කරු කොටසටම සාධාරණ වේතනයක් ගෙවියයුතුය.
පූර්වෝක්ත..........................................................විසින් දෙදහස් ................................... වර්ෂයේ...........
මස ......................දින........................... ස්ථානයේදී පහත සඳහන් සාක්ෂිකරුවන් ඉදිරිපිටදී ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් අත්සන් තබන ලදී.

අත්සන: ......................................
ප්‍රාදේශීය/දිස්ත්‍රික්කය

1. .......................................................... 2. ..........................................................
ලිපිනය :.......................................................... ලිපිනය :..........................................................
.......................................................... ..........................................................

පූර්වෝක්ත ............................................................................................ විසින් දෙදහස් ...........................
වර්ෂයේ...................... මස ................... දින ................ ස්ථානයේදී පහත සඳහන් සාක්ෂි කරුවන් ඉදිරිපිටදී
අත්සන් තබන ලදී ........................................................................ කොන්ත්‍රාත්කරුගේ අත්සන.

1. .......................................................... 2. ..........................................................
ලිපිනය :.......................................................... ලිපිනය :..........................................................
.......................................................... ..........................................................

හරි වැරදි බැලූ නිලධාරියාගේ නම :..........................................................
තරාතිරම :..........................................................
අත්සන :..........................................................

හරි වැරදි බැලූ නිලධාරියාගේ නම :..........................................................
තරාතිරම :..........................................................
අත්සන :..........................................................



CS CamScanner